THE SIGNALLER

SLSC JOURNAL



OCTOBER '98

1

Sch of Sig

1998.01.02 දිනට යෙදුන පස්වන සංඥා රෙජිමේන්තුවෙහි
හතරවන සංවත්සරය සැමරීමෙහි එක් අංගයක් වූ දානමය
පිංකම අණදෙන නිලධාරී ලුතිං/කර් සෝ එම් නවරත්න ගේ
ප්‍රධානත්වයෙන් සිදුකල මොහොත

මීන්නේරිය 1වන සංඥා රෙජිමේන්තු මූලස්ථානයෙහි අභිනවයෙන්
ඉදිකරණ ලද බෝධි ප්‍රාකාරය 1998.06.09 දින සංඥා රෙජිමේන්තු
මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් කේ එස් ලියනගේ පීඑස්සී මැතිතුමා
විසින් විවෘත කිරීමෙන් අනතුරුව පැවති ධර්ම දේශනයේ අවස්ථාවක්

ලුතිං/කර් ජිජී පෙරේරා යූඑස්පී 1998.06.09 වන දින
6 වන සංඥා රෙජිමේන්තුවෙහි අණදෙන
නිලධාරී වශයෙන් වැඩ භාරගත් මොහොත

4 වන සංඥා රෙජිමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරී
පාඨමාලාව සඳහා ක්ෂේත්‍ර සංඥා මධ්‍යස්ථානයක
නිරූපනයක් පානොලුවවෙව්පිටියේ සංවිධානය
කල අවස්ථාව



අනුරාධපුර රණසේවාපුර 3 වන සංඥා රෙජිමේන්තු මූලස්ථානයේ
නව ඒකක දෙදෙසෙහි ඉදිවන බනි/සැරයන් භෝජනාගාරයේ ඉදිකිරීම්
කටයුතු අණදෙන නිලධාරී ලුතිං/කර් ඩබ්පියු වන්දසිරි විසින් පරීක්ෂා
කරණ අයුරු

මංගල කලාපය

" The Signaller " is the half yearly publication of the Sri Lanka Signals Corps.

"ද සිග්නලර්" ශ්‍රී ලංකා සංඥා බලකායේ අර්ධ වාර්ෂික ප්‍රකාශනයයි.

සංස්කාරක මණ්ඩලය:

බ්‍රිගේඩියර් ඩබ් ඩී එන් ප්‍රේමසිරි
කර්නල් කේ එස් ලියනගේ පීඑස්සී
මේජර් එච් පී සෙනෙවිරත්න

කර්තෘ මේජර් එල් එස් පී පෙරේරා

ජායාරූප ශිල්පී මා/සැ දයාරත්න ඒජී

ලිපිනය:
සංස්කාරක
සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය
යුධ හමුදා කඳවුර
පනාගොඩ

දුරකථන / ෆැක්ස් } 01-342818

Next Issue : April 1999

Designed and Printed by
Print Point - 713860

CONTENTS

පිටුව

සිප් සතර

විදුලිය හා ඒ ආශ්‍රිත කරුණු 11
පරිගණක සහ පරිගණක විද්‍යාවට හැඳින්වීමක් 17
ශ්‍රී ලංකා සංඥා බලකායේ ඇති පැරණිතම ගුවන් විදුලි යන්ත්‍ර 22
රේඩාර් (RADAR) පිළිබඳ මූලික හැඳින්වීමක් 26
SYBER WARFARE 29
සංඥා සම්බන්ධතාවය සැපයීමේදී බහුලව භාවිතා වන කනෙක්ටර් වර්ග 33

රණ බිම

ජයසිකුරු ක්‍රියාන්විතයෙහි සංඥා සම්බන්ධතාවය 9

සිව් දිගින්

අඩසිය වසක මතක සටහන් 6
යුහමු සංඥා බළසණය මගින් ඉටුවන සේවය 8
5 ශ්‍රීලංසංබ ආධාරක බළඇණියේ පස්වසරක ගමන්මග 10
සුංඥා පාසැල් මාතාවෝ 16
භක්ති ප්‍රණාමයෙන් අපි ඔබ සිහි කරන්නෙමු 20
A Brief History of The Signal Corps 23
ශ්‍රී ලංකා සංඥා බලකායේ සහ රාජකීය සංඥා බලකායේ මූලාරම්භය මෙසේ සිදුවිය 32
විදේශ පාඨමාලා සහ වීර ක්‍රියා පදක්කම් ප්‍රධානය 35
Officers Enter into Holy Matrimony 37

පන්හිඳ

පෙම්බර සංඥා මැණි 15
හැර නොයම් සටන් බිම ජීවිතය ඇති තුරා 25
යුද්ධයක් ඇත රටේ 34

කෙළි බිම

සංඥා බලකාය වර්ණවත් කල ක්‍රීඩකයන් 38

කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බලකායට 55 වසරක් සපිරෙන මේ අවස්ථාවේදී එළිදක්වන අධ්‍යාපනික සහ වාර්තාමය සඟරාවෙහි මංගල කලාපයෙහි කර්තෘ ලෙස කටයුතු කිරීමට ලැබීමත් එම වගකීම සාර්ථකව ඉටු කිරීමට ලැබීමත් ඉතාමත් ප්‍රීතිමත් කාරණයකි.

මෙම සඟරාව තුලින් සංඥා බලකායෙහි කාලීන සිදුවීම් පිලිබඳ නවකයින් දැනුවත් කිරීමත්, සියලුම නිලයන්ගේ ලේඛණ සහ නිර්මාණ හැකියාවන්, කුලසලතාවන් එළිදැක්වීමටත් ඉමහත් පිටුවහලක් මෙන්ම ඒකකයන් අතර අවබෝධයත්, සම්බන්ධතාවයත් වැඩිදියුණු කර ගැනීමටද ඉමහත් දායකත්වයක් සැලසෙනු ඇත. මෙහි පලවන අධ්‍යාපනික ලිපි මගින් ඔබ සැමගේ තාක්ෂණික සහ වෘත්තීය දැනුම වර්ධනය කරගැනීමටද මහඟු අත්වැලක් වනු ඇත.

සය මසකට වරක් නිකුත් කිරීමට නියමිත මෙම සඟරාවේ ඉදිරි කලාප සඳහා ඔබ සැම විසින් සපයන සියලුම ලිපි නිර්මාණ හැකියාව පරිදි පලකිරීමට කතෘ මඩුල්ල විසින් බලාපොරොත්තු වන අතර ඒ සඳහා ඔබ සැමගේ පූර්ණ සහයෝගය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය මෙම සඟරාවේ පරිපූර්ණත්වයට ඉතාමත් අවශ්‍යතාවයකි.

අවසාන වශයෙන් මෙම සඟරාව එළිදැක්වීමේදී සියලු සංඥා ඒකකයන්හි නිලධාරීන් හා සෙසු නිලයින් ලිපි, වාර්තා සහ වෙනත් නිර්මාණ සැපයීමෙන් සිදුකල දායකත්වය ස්තුති පූර්වකව සිහිපත් කරමි. එමෙන්ම මෙම සඟරාව එළිදැක්වීමේදී ලද පලපුරුද්ද ඉදිරි කලාපයන් පලකිරීමේදී එම කතෘ මණ්ඩලයන් වෙත ඉතාමත් රුකුලක් වන අතර ඔවුන් වෙත සම්පූර්ණ සහයෝගය ලබාදීමටද බලාපොරොත්තු වෙමි.

කර්තෘ

REGIMENTAL BADGE AND THE HISTORY / රෙජිමේන්තු ලාංඡනය සහ එහි ඉතිහාසය

1972 ට පසු ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් භාවිතා කරනු ලබන රෙජිමේන්තු ලාංඡනය.

The Regimental badge used by SLSC since 1972.

1972 ට පෙර ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් භාවිතා කල රෙජිමේන්තු ලංඡනය.

The Regimental badge used by SLSC prior 1972.

According to Greek Mythology "***Zeus***" is the first Greek god who destroyed the gods existing before him and established a new divine order which is known as the Greek divinity. From goddess "***Maia***" the daughter of ***Titan Atlas*** Zeus sired ***Hermes*** alias ***Mercury***. Hermes was born in a Cave on the mount of ***Cellenye*** in ***Southern Arcadia***, and a few hours after being born he had invented the lyre. The same day he came out of the cave, where he found a herd of cattle. Which belonged to his brother ***Apollo***. Hermes drove the cattle away after covering their hooves to prevent them leaving tracks. After having reached a forest, hermes killed and ate two of the cattle and hid the remainder in a glade. Later Apollo discovered the loss. He found Hermes and took him before their father Zeus to face his judgment. Zeus ordered Hermes to return the cattle and as a compansation Hermes gave his Lyre to Apollo Apollo was so delighted with the Lyre, that he presented Hermes with a magic wand. Eger to test its, magical powers Hermes thrust the wand between two quarrelling serpents who coiled themselves around it. This amused him so much that he ordered them to stay therefor ever. That was the origin of ***Caduceus*** known as ***herald's staff***.

Zeus later appointed Hermes messenger of the gods and presented him with the ***Talaria***, (the winged sandles) and the ***petasus*** (the winged hat or the felt hat). He was also the God of eloquence, good luck, wealth, commerce, rain, wind and the protecter of travellers, herds, cheats and thieves. As the deity of athletes, he protected gymnasiums and stadiums. He conducted the souls of the dead to the underworld and was believed to possess magical powers over sleep and dreams.

In the golden era of Greece Hermes carried messages to and fro as its Armies moved across the lands in triumphant glory. So that corp of signals using the figure of Hermes as the cap badge.

Until the year 1972 ***Sri Lanka Signal Corps*** used cap badged of the ***Royal Corp of Signals***. That was designed during the second world war and approved in 1946. In that the figure of Mercury holding a caduceus in the left hand the right hand aloft, poised with the left foot on a globe all silver, above the globe a scrall inscribed "***CERTO CITO***" (***Sure & swift***) and below on each side six ***Laurel leaves*** all gold, the whole ensigned with the ***imperial crown*** in gold. Mercury rest on the globe denoting service over the whole world, and his winged sandles denote the swiftness. The Imperial Crown was replaced by "**Dhamma *Chakraya***", as a symbol of power and the motto "***CERTO CITO***" was replaced by the equivalent term "***STHIRA KSANIKA***", Common usage has led to the figure of Mercury being known as ***Jimmy***. The actual origin of the nickname is unknown.

ග්‍රීක මිත්‍යා කථාවලට අනුව සුස් යනු ග්‍රීක දේවධර්මයෙහි ප්‍රථම දෙවියන් වහන්සේය. ඔහුට සහ මායා යන දෙවිදුවට දාව හර්මීස් හෙවත් මර්කරි, දක්ෂිණ ආකේඩියාවෙහි සෙලනි කඳු ශිඛරයෙහි ගල් ගුහාවක උපත ලැබීය. උපතලද දිනම ඔහු විසින් වීනාවක් සොයාගන්නා ලද අතර ගල් ගුහාවෙන් පිටතට පැමිණියේය. එසේ පැමිනිමෙන් අනතුරුව ඔහු විසින් සිය සොයුරු ඇපලෝට අයත් ගවපට්ටියක් සොරාගෙන එම ගවයන් වනගත ප්‍රදේශයකට රැගෙන ගොස් ගවයන් දෙදෙනෙකු මරා මස් අනුභව කරන ලද අතර, ඉතිරි ගවරැල වනයේම සඟවා තබන ලදී. පසුව ඇපලෝ විසින් මේ පිලිබඳ විමර්ශනය කොට හර්මීස් විසින් මෙය සිදුකල බැව් අනාවරණය වු විගස, හර්මීස් නඩු විභාගය සඳහා සිය පියාවන සුස් ඉදිරියට පමුණුවන ලදී. සුස් විසින් දෙනු ලැබූ තින්දුවට අනුව හර්මීස් විසින් ගව පට්ටිය ආපසු ඇපලෝ වෙත භාරදුන් අතර ඔහු අනුභව කල ගවයන්ට වන්දි වශයෙන් තමා සතු වීනාව ඇපලෝ වෙත පරිත්‍යාග කරන ලදී. මින් ප්‍රීතියට පත් ඇපලෝ හර්මීස් හට ඉන්ද්‍රජාලිය යෂ්ටියක් ත්‍යාගකරන ලදී. මෙහි ඉන්ද්‍රජාලිය බලය පිරික්සීම වස් හර්මීස් විසින් කලහකාර සර්පයන් දෙදෙනෙකුට මෙයින් අනිනු ලැබූ අතර එම සර්පයන් දෙදෙනා යෂ්ටිය වටා එති නිසොල්මන් විය. හර්මීස් මෙයින් මවිතයට පත්වූ අතර, සර්පයන් දෙදෙනාට සදාකාලිකව එම යෂ්ටියෙහි රැඳී සිටීනසේ විධානය කරන ලදී. මෙය හර්මීස් සතු රාජ්දූත යෂ්ටියෙහි ආරම්භය වේ.

සූස් විසින් හර්මීස් දෙවියන්ගේ පණිවිඩකරු තනතුරට පත්කරන ලද අතර පියාපත් සහිත පාවහන් යුවලක්ද (ටැලේරියා) සහ පියාපත් සහිත හිස්වැස්මක්ද (පෙටාසස්) ඔහුවෙත පරිත්‍යාගකරන ලදී. හර්මීස් සමානාත්මතාව, ධනය, වාසනාමහිමය, වෙළදාම, වර්ෂාව සහ සුළඟටද අධිපති දෙවිදු ලෙස සලකනු ලැබූ අතර, සංචාරකයන්, එඬේරන්, වංචාකරුවන් සහ සොරුන්ගේ ආරක්ෂකයා විය. මලල ක්‍රීඩකයන්ගේ දේවතාවන් ලෙස ක්‍රීඩාංගන සහ ක්‍රීඩාමණ්ඩපයන්හි ආරක්ෂාවද, මලවුන්ගේ ආත්මයන්ට පාතාල ලෝකය වෙත මඟ පෙන්වීමද ඔහු අතින් සිදුකල මෙහෙවරක් ලෙස මිත්‍යාවන්හි කියවේ.

ග්‍රීක ඉතිහාසයේ ස්වර්ණමය යුගයේදී හර්මීස් විසින් සිදුකරණ ලද කාර්යක්ෂම සහ වේගවත් පණිවිඩ හුවමාරුව හේතුකොට ගෙන ග්‍රීක හමුදාවන් විශාල ප්‍රදේශයක බලය තහවුරු කර ගැනීමට සමත්විය. මෙය සංකේතවත් කරමින් සංඥා බලකායේ රෙජිමේන්තු ලාංඡනය සඳහා මෙම දෙවියන්ගේ රූපය යොදාගෙන ඇත.

1972 වර්ෂය දක්වා ශ්‍රී ලංකා සංඥා බලකාය, රාජකීය සංඥා බලකායට අයත් රෙජිමේන්තු ලාංඡනය භාවිතා කරන ලදී. එය දෙවන ලෝක යුද්ධය සමයෙහි සැලසුම්කොට වසර 1946 දී අනුමත කරන ලද්දකි. එම ලාංඡනයෙහි හර්මීස් දෙවියන්ගේ රූපය වම් අතෙහි යෂ්ටිය සහිතවද දකුණු අත හිසට ඉහලින්ද වම් පාදය ලෝක ගෝලය මතද සිටිනසේ සකසා ඇත. ලෝක ගෝලය හා යාකරන ලද උදාත පාඨ තිරුවකින්ද, ලෝක ගෝලය පසුබිමෙහි පුරාතන ග්‍රීසියේ උසස් ගෞරව දැක්වීම සඳහා උපයෝගී කරගත් ලෝරල් ශාඛ පත්‍ර 12 කින්ද සමන්විත වේ. මෙම දෙවියන් ලෝක ගෝලය මත සිටීමෙන් මුලු ලොවටම සිය පණිවිඩ සේවාව සලසන බැව් සංකේතවත් කරනු ලබන අතර පියාපත් සහිත පාවහන් යුගලය වේගවත් භාවය සංකේතවත් කරනු ලබයි. මෙම රූපයට ඉහලින් රාජකීය ඔටුන්න යොදා ඇත. 1972 න් පසු ශ්‍රී ලංකා සංඥා බලකාය ශ්‍රී ලංකාවට ආවේනික ලෙස රාජකීය ඔටුන්න වෙනුවට ධර්ම චක්‍රයද, ස්ථිර ක්ෂණික යන උදාත පාඨයද සහිත රෙජිමේන්තු ලාංඡනය භාවිතා කරනු ලබයි. මෙම රූපය ජිමී යන අන්වර්ථ නාමයෙන්ද ප්‍රසිද්ධත්වයට පත්ව ඇති අතර එය සත්‍යවශයෙන් කෙලෙස පටබැදුනේද යන්න නොදනී.

MESSAGE FROM THE COLONEL COMMANDANT

It is with much pleasure that I send this message to the maiden issue of the magazine published by the SLSC, in my capacity as the Colonel Commandant.

In a fast developing world where the use of advances in science and technology for purposes of war poses a challenge in the on-going conflict, it is essential that all ranks especially of the SLSC are skilled and proficient to face this challenge. It is our responsibility that we conduct our technical and military training needed by the SLSC with perseverance dedication and leadership in order to achieve maximum levels of efficiency. I believe that you will improve your professional knowledge and social awareness as envisaged by this educational and informative magazine for which purpose it has been launched.

The success of this magazine will depend upon the assistance and dedication of all ranks of the SLSC and I expect all of them to extend their maximum co-operation in this regard.

While I appreciate the provision of communication facilities to many Divisions by as few as 3 units to meet Operational reqirements needed with the rapid expansion of the Army within a short duration.It is with pride that I commend the heroic achievements of the SLSC RFT units, established to perform the role of the Infantry.

Lastly while I sorrowfully salute the officers and other ranks of the SLSC who made the supreme sacrifice in the cause of preserving the territorial integrity of our motherland. I pray that they may attain Nibbana.

May the blessings of the Triple Gem be with you, the ex-servicemen, civilian, employees and their families for ever.

AMCWB Seneviratne USP psc
Major General
Colonel Commandant

බලකාධිපති තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පලකරනු ලබන සඟරාවෙහි මංගල කලාපයට සංඥා බලකාධිපති වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන මා අතිශයින් සතුටු වෙමි.

ලෝකයේ සීඝ්‍රයෙන් සිදුවන විද්‍යාත්මක සහ තාක්ෂණික දියුණුව වර්තමානයේ යුද්මය අවශ්‍යතාවයන් සඳහා උපයෝගී කර ගැනීම අද අප මුහුණ දෙන ක්‍රියාන්විතයන්හිදී මහත් අභියෝගයක්ව පවතී. එම අභියෝගයට සාර්ථකව මුහුණදීමට සෑම අතින්ම ප්‍රගුණ කළ උපරිම ශිල්පීය ඥාණයක් විශේෂයෙන්ම සංඥා බලකායේ සෑම නිළයෙක්ම සතුවිය යුතුය. නොපසුබට උත්සාහයෙනුත් කැපවීම සහ නායකත්වයකින් යුතුව විද්‍යානුකූලව බලකායට අවශ්‍ය කාර්මික තාක්ෂණික සහ යුද්මය පුහුණුවීම් නිසි පරිදි සිදුකිරීමෙන් අපගේ වෘත්තියමය දක්ෂතාවයන් උපරිම මට්ටමකට ගෙනඒම අප සතු වගකීමකි. එම වෘත්තිය දැණුමත් සමාජයීය අවබෝධයත් ලබා දීම වස් පළකරනු ලබන මෙම අධ්‍යාපනික හා වාර්තාමය සඟරාව ඔබ සැමටම ඉතා එලදායී වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

මෙම සඟරාව පලකිරීමේදී සෑම සංඥා රෙජිමේන්තුවකම සියලුම නිළයින්ගේ කැපවීම සහ සහය මෙම සඟරාවෙහි සාර්ථකත්වය සඳහා මහත් පිටුවහලක් වනු ඇති බැවින් ඒ සඳහා ඔබ සැමගේම සහයෝගය උපරිම මට්ටමකින් ලැබෙනු ඇතැයි මා අපේක්ෂා කරමි.

කෙටි කාලපරිච්ඡේදයක් තුල ක්‍රියාන්විත අවශ්‍යතා උදෙසා ශ්‍රී ලංකා යුද හමුදාවේ පුලුල් ව්‍යාප්තියත් සමඟ සංඥා රෙජිමේන්තු තුනක් වැනි සුළු ප්‍රමාණයකින් සේනාංක විශාල ප්‍රමාණයකට අඛණ්ඩ සංඥා සම්බන්ධතාවයක් ලබාදීමට හැකිවීම මේ අවස්ථාවේදී අගය කරනු ලබන අතර, පාබල රාජකාරීන් සඳහා ස්ථාපනය කරන ලද සහය පාබල සංඥා ඒකකයන් ක්‍රියාන්විත රාජකාරීන්හිදී දැක්වූ විජයග්‍රාහී අභීත දක්ෂතාවයන්ද ඉතා සාඩම්බරව අගය කරමි.

අවසාන වශයෙන් පසුගිය කාලපරිච්ඡේදය තුල මාතෘ භූමියේ ඒකීයභාවය ආරක්ෂා කිරීම උදෙසා තම ජීවිතය පූජා කළ සංඥා බලකායේ නිළධාරීන් සහ සෙසු නිළයින් වෙත මහත්වූ සංවේගයෙන් යුතුව මාගේ ගෞරවනීය ආචාරය පිරිනමන අතර, ඔවුනට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

ඔබ සැමදෙනාටත් සේවාමුක්ත සියලුම නිළයින්ටත් සිවිල් සේවක මහතුන්ටත් සැම දෙනාගේම පවුල් වල සාමාජිකයින්ටත් ත්‍රිවිධ රත්නයේ පිහිට සහ ආරක්ෂාව ලැබේවායි නිරතුරුව ප්‍රාර්ථනා කරමි.

ඒඑම්සීඩබ්බී සෙනෙවිරත්න යුඑස්පී පීඑස්සී
මේජර් ජෙනරල්
බලකාධිපති

MESSAGE FROM THE BRIGADE COMMANDER

As the Brigade Commander of the Signals Brigade, it is my privilege to send this message of felicitation to the maiden issue of the magazine published by the Corps of Signals.

The services rendered by Officers and Other ranks of the Corps of Signals by serving in contact with infantry troops and providing communication facilities to Divisions of the Sri Lanka Army fighting in the North East at the risk of their lives, to maintain the territorial integrity and unitary character of our Motherland is highly commendable. At a moment when the North/East War is at a decisive stage, the dedicated, loyal and efficient services rendered by officers and other ranks of the Corps of Signals to provide communication for "Op Jayasikiru" requirement amidst much hardship is praiseworthy. I appreciate the confidence and exceptional skill displayed in the performance of duties and professionalism acquired in the field of communication supply and in field duties through exposure to handling high-tech communication equipment during the past few years.

This magazine will be of immense vlaue to improve technological skills and battle skills of all Signal Officers and Other ranks and develop mutual understanding between all regiments through the medium of articles published on operational and other important activities of other regiments.

It is a matter for pride and satisfaction that past history of operations reveal that the corps of signals keeps the Signals flag flying high, as a distinctive Unit of the Sri Lanka Army. I offer my respects all to ranks of the Corps who made the supreme sacrifice to preserve the unitary character and territorial integrity of our Motherland during the past. Similarly, I wish the disabled fast recovery to normal condition.

It is my belief that you will dedicate yourself and continue to perform your valuable services in the future by further developing your sense of discipline, leadership dedication and courage, based on the training in the profession and in conformity with the traditions of the Army.

Finally, I wish all Officer and Other ranks and their families including civilian employees, a peaceful and prosperous future.

WDN Premasiri
Brigadier
Signals Brigade Commander

සංඥා බලසේනාධිපති තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් පලකරනු ලබන සඟරාවෙහි මංගල කලාපයට සංඥා බලසේනාධිපති වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

මව්බිමේ ඒකීයභාවයත්, භෞමික අඛණ්ඩතාවයත් රැක ගැනීම වස් උතුරු නැගෙනහිර ක්‍රියාන්විතයන්හි යෙදී සිටින ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේනාංක සඳහා පාබල හමුදා සමග උරෙන් උර ගැටී සංඥා සම්බන්ධතා සපයා දෙමින් සංඥා බළකායේ නිළධාරීන් සහ සෙසු නිළයින් තම ජීවිත පරදුවට තබා සිදුකරනු ලබන සේවය ප්‍රසංශනීය වේ. උතුරු නැගෙනහිර කෙරෙන යුද්ධයේ තීරණාත්මක අවධියක පසුවන මෙවැනි අවස්ථාවකදී විශේෂයෙන්ම ජයසිකුරු ක්‍රියාන්විතය සඳහා සංඥා බළකායේ නිලධාරීන් සහ සෙසු නිළයින් කාර්‍යක්ෂමව විශ්වාසවන්තව සහ ධෛර්‍යමත්ව නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ සංඥා සම්බන්ධතාවන් සැපයීමෙන් සිදු කරන මෙහෙය අනභිබවනීය වේ. පසුගිය වසර කිහිපය තුල යුධ හමුදාවට ලබා ගන්නා ලද අධි තාක්ෂණයෙන් යුතු සංඥා උපකරණ පරිහරණය කිරීමටත් ක්‍රියාන්විතයේදී ලද පලපුරුද්ද සහ අත්දැකීම් තුලින් සංඥා සම්බන්ධතා සැපයීමේ සහ සංග්‍රාමික කුසලතාවයන් දියුණු කර ගැනීමටත්, ආත්ම විශ්වාසයෙන් යුතුව ඉතා උසස් මට්ටමකින් රාජකාරීන් හි නියැලීමේදී දැක්වූ විශිෂ්ඨ දක්ෂතාවය මේ අවස්ථාවේදී අගය කිරීමට මම කැමැත්තෙමි.

එමෙන්ම මෙම සඟරාව තුලින් නවීන විද්‍යුත් තාක්ෂනික ශිල්ප සහ සංග්‍රාමික ශිල්ප පිලිබඳව සංඥා නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ දැනුම වැඩිදියුණු වෙනවා මෙන්ම බලකාය තුල ඇති සෑම රෙජිමේන්තුවකම සිදු කෙරෙන ක්‍රියාන්විත සහ වෙනත් වැදගත් සිදුවීම් අලලා සැකසෙන ලිපි මගින් බලකාය තුල සියලුම රෙජිමේන්තු අතර, අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කර ගැනීමට ඉමහත් රුකුලක් වනු ඇත.

ක්‍රියාන්විත ඉතිහාසය දෙස ආපසු බලන කල යුධ හමුදාවේ විශිෂ්ඨ බලකායක් වශයෙන් සංඥා බළකායද බළකා ධජය ඉහලින්ම ලෙල දෙවමින් කටයුතු කිරීම ආඩම්බරයට මෙන්ම සතුටටද කරුණකි. ගෙවීගිය කාල පරිච්ඡේදය තුල මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමට තම දේශය වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයෙන් යුතුව තම ජීවිතය පුද කලාවූ, බළකායේ සියළුම රණවිරුවන්ට ගෞරවනීය ලෙස මා අචාර කරමි. එමෙන්ම ක්‍රියාන්විතයේදී ආබාධිත වූ සියළුම රණවිරුවන් කඩිනමින් ප්‍රකෘති තත්වයට පැමිණේවායි ප්‍රාර්ථනා කරමි.

තම මාතෘ භූමිය බේරා ගැනීමට හා බෙදුම්වාදී ත්‍රස්ථවාදීන් පරාජය කර ඒකීය වූත් සෞභාග්‍යමත් වූ ශ්‍රී ලංකාවක් බිහි කරනු වස් සටන් බිමෙහි පෙරමුණ ගෙන සිටින සංඥා බළකායේ අප සියළු දෙනා අත්වැල් බැඳ සාමය උදාකරණ අදිටනින් යුතුව සේවය කැප කිරීමට හිතට ගෙන කටයුතු කල යුතු වේ. මේ දක්වා ඔබ විසින් කරන උදාර සේවාව මින් ඉදිරියටත් නොඅඩුව නොපිරිහෙලා ලබාදීම පිණිස විනය, නායකත්වය, කැපවීම, චිත්ත ධෛර්‍යය යන මූල ධර්ම වර්ධනය කර ගනිමින් අපගේ වෘත්තියට අදාලව ලබා ගන්නා ලද මනා පුහුණුව තුලින් හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව කටයුතු කිරීමට ඔබ සියළු දෙනාම අදිටන් කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකායේ සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් හට හා තම පවුල් වල අය ඇතුළු සිවිල් අයවලුන් හට සාමයෙන් යුත් සමෘධිමත් අනාගතයක් උදාවේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනය කරමි.

ඩබ් ඩී එන් ප්‍රේමසිරි
බ්‍රිගේඩියර්
සංඥා බලසේනාධිපති

MESSAGE FROM THE REGIMENTAL CENTRE COMMANDANT

As the Centre Commandant I am privileged to send a message of good wishes to the magazine launched by SLSC.

A great responsibility lies on all ranks of the Army as pioneers in the efforts being made to maintain the territorial integrity and future prosperity of Sri Lanka. It is imperative that a perfect soldier with knowledge, language proficiency' good qualities and self confidence gained by developing his intellectual facilities is needed for this task.

It is my belief that the magazine launched by the SLSC is intended to improve your educational and professional knowledge. The interest and co-operation extended by all the Signal Regiments towards launching this magazine amply illustrates the unity that exists within the SLSC.

I recall with pride not only the Signal tasks performed and performance of Operational duties in association with other infantry units but also the distinction gained by the Signal Regiments by displaying the ability of the SLSC to train and produce soldiers with exceptional fighting ability.

At this moment I salute all ranks who made the supreme sacrifice and those disabled while on duty.

I hereby extend my best wishes to all ranks of the SLSC, their families, civilian employees and their families on behalf of the Regimental Centre.

KS Liyanage psc
Colonel
RegimentalCentre Commandant

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය එලි දක්වන සඟරාවෙහි මංගල කලාපයට රෙජිමේන්තු මධ්‍යස්ථාන් සේනාවිධායක වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලැබූ වරප්‍රසාදයක් ලෙස සලකමි.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයත් අනාගත අභිවෘද්ධියත් රැකගැනීම සඳහා දරණ ප්‍රයත්නයේ නියමුවන් වශයෙන් හමුදාවෙහි සෑම නිලයකුටම පැවරී ඇත්තේ ඉමහත් වගකීමකි. එම වගකීම නොපිරිහෙලා ඉටු කිරීමට සෑම නිලයකුම තම බුද්ධි මට්ටම ඉහල නැංවීමත් එමගින් හොඳ ආත්ම විශ්වාසයක් ඇති කරගැනීමත්, උගත්කම තාක්ෂණික දැනුම සහ ගුණධර්ම වලින් පරිපූර්ණ සොල්දාදුවකු වීමත් අවශ්‍යවේ. සංඥා බලකාය එලිදක්වන මෙම සඟරාව ඔබ සැමගේ අධ්‍යාපන මට්ටම සහ තාක්ෂණික දැනුම දියුණු කිරීම වස් ඉමහත් පිටුවහලක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. මෙම සඟරාව එලිදැක්වීමේදී සංඥා බලකායේ සියලුම රෙජිමේන්තු විසින් දැක්වූ උනන්දුව සහ සහයෝගය බලකාය තුල එකමුතුභාවය මනාව පිලිබිඹු කිරීමකි.

සහායක බලකායන් ලෙස පාබල ඒකකයන්ට අවශ්‍ය සංඥා සම්බන්ධතාවය සැපයීමට අමතරව පාබල රාජකාරීන් සඳහාද රණ ඒකකයන් හා සම්බන්ධව ක්‍රියාන්විත රාජකාරීන්ට එක්වී සිටීම සහ මනා සංග්‍රාම ශක්තියකින් හෙබි සෙබලුන් පුහුණු කිරීමේ කටයුතු වලදීත් සියලුම සංඥා රෙජිමේන්තු දක්වා ඇති හැකියාවත් එමගින් බලකාය වෙත ලබාදුන් කීර්තිනාමයත් මේ අවස්ථාවේදී සාඩම්බරයෙන් සිහිපත් කිරීමට කැමැත්තෙමි.

රාජකාරියේ යෙදී සිටියදී ජීවිත පරිත්‍යාග කරන ලද සහ ආබාධිත තත්වයට පත්වූ සියලුම නිලයන්ට මාගේ ගෞරව ප්‍රනාමය මේ අවස්ථාවේදී පුදකරමි.

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් සංඥා බලකායේ සියලුම නිලයන්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් සිවිල් සේවකයන්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් මාගේ සුභාශිංසන පිරිනමමි.

කේ එස් ලියනගේ පීඑස්සී
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක

අඩසිය වසක මතක සටහන්

මේජර් ජෙනරාල් සීජේ අබේරත්න

මේජර් ජෙනරාල් ඒඑම්සීඩබ්බී සෙනවිරත්න
යූඑස්පී පීඑස්සී

ස්වකීය සේවා කාලය තුලදී මේජර් ජෙනරාල් පදවියට පත් ශ්‍රී ලංකා සංඥා බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

1. 1943 ඔක්තෝම්බර් මස 19 දින ශ්‍රී ලංකා රජයේ ගැසට් අංක 9183 පලකිරීමෙන් අනතුරුව සංඥා බලකායේ මූලාරම්භය සිදුවිය.

2. 1947 වසරෙහි ලංකා ආරක්ෂක හමුදාවෙහි ප්‍රතිසංවිධානයත් සමඟ සංඥා බලකාය යටතේ ස්වේච්ඡා සංඥා බලඝණයක් ආරම්භ විය.

3. 1949 වසරෙහි ශ්‍රීලංකා යුද හමුදාවේ ආරම්භයත් සමග නිත්‍ය සංඥා කණ්ඩයේ ආරම්භය විය.

4. 1951 වසරෙහි රාජකීය සංඥා බලකාය විසින් භාවිතා කරන සිරස්ක ලාංඡනය "CEYLON" යන අමතර වචන කණ්ඩයද සහිතව පැළඳීමේ අනුමැතිය ලැබීම සහ රාජකීය සංඥා බලකා තේමා ගී අනුවාදනය "BEGONE DULL CARE" භාවිතා කිරීම ආරම්භ විය.

5. 1952 වසරේ නිත්‍ය සංඥා බණ්ඩය සංඥා බලඝණය දක්වා ව්‍යාප්ත විය.

6. 1952 වසරේ නීති විරෝධී ලෙස රට තුලට සංක්‍රමනය වන ජනයාට එරෙහිව කරන ලද "ඔප්ස් මොන්ටි" ක්‍රියාන්විතය සහ 1953 "හර්තාල්" නමින් ප්‍රචලිත දේශපාලන අරගලය සඳහා ප්‍රථම වරට ක්‍රියාන්විත සංඥා සම්බන්ධතාවය සැපයීම.

7. 1957 වසරෙහි දිවයිනේ ඇතිවූ ජල ගැල්මෙන් විපතට පත්වූවන් බේරා ගැනීම සඳහා සිදුකල ක්‍රියාන්විතය සඳහා සංඥා සම්බන්ධතා සැපයීම.

8. 1958 වසරේදී ශ්‍රී ලංකා සංඥා බලකායෙහි 1 වන රෙජිමේන්තුව පිහිටුවීම. ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩී වී බ්‍රෝහියර්.

9. 1960 වර්ෂයෙහි ප්‍රථම වතාවට සංඥා බලකාය විසින් වාහන වල සවිකරන ලද සී 11/ආර් 210 ගුවන් විදුලි යන්ත්‍ර භාවිතා කිරීම. එසේම පලමු වරට එස්එස්බී (සිංගල් සයිඩ් බෑන්ඩ්) ගුවන් විදුලි යන්ත්‍ර ශ්‍රී ලංකා යුද හමුදාවට හඳුන්වා දීම.

10. 1960 දශකයේ ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිදුවූ වැඩ වර්ජන සමයේදී සංඥා බලකායේ නිලයන් විසින් ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රචාරන උපකරන ක්‍රියා කිරීමේ වගකීම සිදු කිරීම.

11. 1962 වසරේදී පනාගොඩ යුද හමුදා ජනපදයේදී සංඥා සම්බන්ධතාවය සඳහා දිගු 200 ධාරිතාවයකින් යුත් හුවමාරුව ස්ථාපනය කිරීම. මෙම හුවමාරුව තවමත් ක්‍රියාකාරී තත්වයේ පවතී.



ශ්‍රීලංසංබ පලමුවන අණදෙන නිලධාරී ලුති කර් ඩීවී බ්‍රෝහියර් විසින් අණදෙන නිලධාරී තනතුර
අත්හැරීමේ දිනදී ගන්නා ලද සමූහ ඡායාරූපය

අඩසිය වසක ගමනට උරදුන් නිළධාරී නායකත්වය
සහ සෙබල නිපුනත්වය

12. 1964 වසරේදී සංඥා පුහුණු අංශය ආරම්භ කිරීම.

13. 1964 වසරේදී චැනල් 9 කින් යුත් ගුවන් විදුලි ප්‍රති විකාශණ පද්ධතියක් පනාගොඩ සහ යුද හමුදා මූලස්ථානය අතර සංඥා සම්බන්ධතාවය සඳහාත්, චැනල් 2 කින් යුත් ගුවන් විදුලි ප්‍රති විකාශන පද්ධතියක් පනාගොඩ සහ කටුකුරුන්ද පලවන සිංහ රෙජිමේන්තුව සමඟ සංඥා සම්බන්ධතාවය පිහිටුවීම සඳහාත්, ස්ථාපනය කිරීම.

14. 1972 වසරෙහි පලවන සංඥා රෙජිමේන්තුව, මූලස්ථාන බලඝණයක්, ක්‍රියාන්විත සංඥා සම්බන්ධතා බලඝණ 2ක් සහ පුහුණු බලඝණයකින් සමන්විත වන පරිදි ව්‍යාප්ත වීම.

15. 1981 වසරේ සංඥා, අලුත්වැඩියාවන් සඳහා තිබූ "එම්" කණ්ඩය බලඝණයක් දක්වා ව්‍යාප්ත වීම.

16. 1988 අප්‍රේල් මස 4 වන දින සංඥා බළසේනාව පිහිටුවීම. ප්‍රථම බලසේනාධිපති කර්නල් සීජේ අබේරත්න.

17. 1988 වසරේ උතුරු ප්‍රදේශයේ ක්‍රියාන්විත සංඥා සම්බන්ධතාව සඳහා 3 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව සංවිධානය වීම සහ 1989 මාර්තු මස 09 දින එම රෙජිමේන්තුවේ ආරම්භය. ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒ ර් ටී පෙරේරා.

18. 90.10.19 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය ආරම්භ විම. ප්‍රථම රෙජිමේන්තු ආඥාපති බ්‍රිගේඩියර් සී ජේ අබේරත්න.

19. 91.06.05 දින නැගෙනහිර ප්‍රදේශයේ ක්‍රියාන්විත සංඥා සම්බන්ධතාව සඳහා 04 වන සංඥා රෙජිමේන්තුව ආරම්භ කිරීම. ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච් එම් විත්‍රරන්ජන්.

20. 1991 වසරේ ශ්‍රී ලංකා යුද හමුදාවට පරිඝණක යන්ත්‍ර හඳුන්වා දෙමින් 91.08.23 දින සංඥා බලසේනාව යටතේ විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය ආරම්භ වීම.

21. 1991 වසරේ තාක්ෂණික දියුණුවේ වර්ධනයත් සමඟ යුද හමුදා මූලස්ථානයේ ස්ථාපිත ක්‍රොස් බාර් හුවමාරුව වෙනුවට නව ස්වයංක්‍රීය හුවමාරුවක් ස්ථාපනය කිරීම.

22. 92.08.01 දින ශ්‍රී ලංකා සංඥා බලකා ඉතිහාසයේ ප්‍රථම මේජර් ජෙනරාල් වශයෙන් බ්‍රිගේඩියර් සී ජේ අබේරත්න මේජර් ජෙනරාල් නිලය දක්වා නිල උසස් වීම් ලැබීම.

23. 92.01.01 දින සංඥා බලකායේ සහ වෙනත් ඒකක වල නිලයන්හි සංඥා පුහුණු වීම් සඳහා සංඥා පුහුණු පාසල මහනුවර - බූවැලිකඩ ස්ථාපනය කිරීම.

24. 92.01.01 දින සංඥා මූලික වැඩපල ව්‍යාප්ත වීමත් ප්‍රතිස්ථාපිත කිරීමත් සිදුවිය.

25. 93.10.19 දින ශ්‍රීලංකා සංඥා බලකාය සිය 50 වන සංවත්සරය උත්සවාකාරයෙන් සැමරීම.

26. ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා සහායක බලඇණි අවශ්‍යතාවය සපුරා ලීම වස් 94.01.02 දින 05 වන දින ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව පිහිටුවීම. ප්‍රථම අණදෙන නිලධාරී මේජර් ඊපීද ඉසෙඩ් අබේසේකර.

27. ක්‍රියාන්විත රාජකාරීන්හි අවශ්‍යතාවයන් බහුලත්වය උදෙසා සහායක බල ඇණි අවශ්‍යතාවයන් සපුරාලීමට 97.01.10 දින 06 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව පිහිටුවීම. ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සී වීරතුංග.

28. ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය මගින් පල කරන ලද නියෝගයන්ට අනුකූලව 97.01.20 දින සිට බල පැවැත්වෙන පරිදි සංඥා රෙජිමේන්තු ආඥාපති තනතුර "බලකාධිපති" වශයෙන් නම් කිරීම. ප්‍රථම බලකාධිපති බ්‍රිගේඩියර් ඒ එම් සී ඩබ් බී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී

29. 98.02.23 වන දින ශ්‍රී ලංකා සංඥා බලකා ඉතිහාසයේ සංධිස්ථානයක් සනිටුහන් කරමින් බ්‍රිගේඩියර් ඒ එම් සී ඩබ් බී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී මේජර් ජෙනරාල් නිලය දක්වා නිල උසස් වීම් ලැබීම.

The safty honour and welfare of your country comes first always and everytime"

The honour welfare and comfort of the men you command comes next'

Your own ease, comfort and safty comes last always and everytime.

යුහමු සංඥා බළසණය මගින් ඉටුවන සේවය

යුද හමුදා මූලස්ථානයේ සියළුම සංඥා රාජකාරී ඉටුකිරීම සඳහා මෙම සංඥා බළසණය ස්ථාපිත කර ඇත. මේ සඳහා මේජර් නිළයේ එක් නිළධාරියෙකු ඇතුළුව සංඥා ඒකක වෙතත් ඒකක ආබාධිත සෙනින් සහ කාන්තා සෙබළියන් ගෙන් සමන්විත 98 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇත. මෙම බළසණය යටතේ පහත සඳහන් ස්ථානයන් බළසණාධිපතිගේ අධීක්ෂණය යටතේ පාලනය වනු ලබයි.

අ. ලිපි බෙදාහැරීමේ මධ්‍යස්ථානය
ආ. වීඑච්එෆ් ගුවන් විදුලි සංඥා මැදිරිය
ඇ. එච් එෆ් ගුවන් විදුලි සංඥා මැදිරිය
ඈ. යුහමු ස්වයංක්‍රීය දුරකථන හුවමාරුව
ඉ. විශේෂ ධාවන පැදි අංශය
ඊ. දුරකථන මාර්ග නඩත්තු අංශය
උ. ස්වයංක්‍රීය විනිමය
ඌ. සංඥා යැවීමේ සහ ලබාගැනීමේ අංශය

මේ අතරින් ලිපි බෙදාහැරීමේ මධ්‍යස්ථානය ප්‍රධාන තැනක් ගනී. එනම් සියළුම යුද හමුදා ඇයවළුන්ගේ ලිපි නිවසනින් තම අතටත් තමා අතින් නිවසනටත් යැවෙන කේන්ද්‍රීය ස්ථානය යුහමු ලිපි බෙදාහැරීමේ මධ්‍යස්ථානය වේ. මෙම රාජකාරී ඉටුකිරීම, ක්‍රියාන්විතයේදී ආබාධිත තත්වයට පත් පාබල ඒකකයන් හි ආබාධිත සෙනින් විසින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා මා/සැරයන් වරයෙක් ඇතුළු ආබාධිත සෙනින් 27 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් යොදවා ඇත. දිනපතා මධ්‍යම තැපැල් හුවමාරුව වෙතින් යුහමු ලිපි මල්ල රැගෙන ඒම සහ එහි ඇති ක්‍රියාන්විත ප්‍රදේශයන් හි ලිපි වෙනම තෝරා ප්‍රමාදයකින් තොරව ගපාම(රත්) වෙත රැගෙන යාම සහ ක්‍රියාන්විත ප්‍රදේශයන් වෙතින් යුහමු වෙත ලැබෙන ලිපි අතරෙන් නිළධාරී/සෙබළුන් ගේ ඥාතීන් වෙත යැවෙන ලිපි මධ්‍යම තැපැල් හුවමාරුව වෙත භාරදීම මෙම අයවළුන් ගේ වගකීම වේ. මීට අමතරව ලිපි ලියාපදිංචි කිරීම සඳහා කාන්තා සෙබළියන් 02 ක් යොදවා ඇති අතර, ලියාපදිංචි කර ආරක්ෂා සහිතව ඒ ඒ ස්ථානයන් වෙත යැවීම මෙම සෙබළියන් දෙදෙනාගේ කාර්ය වේ.

නවද මෑතක සිට යුද හමුදා පති තුමාගේ විශේෂ නියෝගයක් මත ප්‍රදේශ මූලස්ථාන හරහා හමුදා අයවළුන් ගේ ලිපි යොමු කිරීමේ වැඩ පිළිවෙලක් අරඹා ඇත. මෙය යුද හමුදා නව තැපැල් සේවය නමින් හඳුන්වයි. මෙමගින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින නිළධාරී/සෙසුනිළයන් ගෙන් නිවසනටත් නිවසනින් නිළධාරී/සෙසුනිළයන් හටත් යැවෙන ලිපි ප්‍රමාදයකින් තොරව ඔවුන් අතට පත්වේ. මෙම කාර්ය සඳහා ආබාධිත තත්වයට පත් පාබල ඒකකයන් හි සෙනින් 50 ක් ඒ ඒ ප්‍රදේශ මූලයන් වෙත මෙම බළසණය මගින් යාකර ඇත. දැනට ඔවුන් විසින් මෙම කාර්ය ඉතා උසස් අන්දමින් ඉටු කරනු ලබයි.

යුහමු දුරකථන හුවමාරුවෙහි රාජකාරියේ යෙදී සිටින
යුද හමුදා කාන්තා බලකායේ සෙබළියන්

වී එච් එෆ් ගුවන් විදුලි සංඥා මැදිරිය

මෙම සංඥා මැදිරිය මගින් හමුදාපති තුමාගේ සහ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ ආරක්ෂක අංශයන් වෙත ගුවන් විදුලි යන්ත්‍ර සැපයීම එහි නඩත්තුව හා හදිසි අවස්ථාවන් සඳහා ගුවන් විදුලි සම්බන්ධතාවය ලබාදීම වැනි සේවයන් ඉටු කරනු ලබයි.

මීට අමතරව ක්‍රියාන්විත ප්‍රදේශයන් සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීම එමගින් යුහමු උසස් අධ්‍යක්ෂක මණ්ඩල වෙත යුදමය තොරතුරු ලබාදීම හා රහස්‍ය ජාලය මගින් සංඥා යොමුකිරීම ලබාගැනීම කරනු ලබයි. මෙම මැදිරිය ක්‍රියාන්විත අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි.

එච් එෆ් ගුවන් විදුලි සංඥා මැදිරිය

එච් එෆ් ගුවන් විදුලි පාලන ජාලයද කාන්තා සෙබළියන් අතින් ඉටු කෙරෙන තවත් විශේෂිත රාජකාරියකි. එනම් ක්‍රියාන්විතයේ යෙදී සිටින නිළධාරී/සෙසුනිළයන් හට යොමු කිරීමට ලැබෙන හදිසි රාජකාරීමය සහ අවමංගල්‍ය වැනි සංඥා දුරකථන පහසුකම් නොමැති ප්‍රදේශයන් වෙත එච් එෆ් පාලන ජාලයේ උප ස්ථානයන් මගින් ඉතා කෙටි කලකින් ආරක්ෂා සහිතව නිවැරදිව ලබාදීමද මොවුන්ගේ වගකීම වේ.

ස්වයංක්‍රීය විනිමය

යුධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත ස්වයංක්‍රීය විනිමය යනු යුහමු දුරකථන හුවමාරුවේ හදවත බඳුවේ. දුරකථන හුවමාරුවේ විටින් විට ඇති වන ගැටළු මෙම විනිමයේ පරිඝණකය මගින් පරීක්ෂාකර ඉතා කෙටි කලකින් යථා තත්වයට පත්කිරීමට එහි සිටින කාර්ය මණ්ඩලය සමත්වේ. මීට අමතරව නව යුහ දිගුවන් ලබාදීම සහ ලබාදී ඇති සියළුම යුහ දිගුවන් හි අංකයන් දත්ත කවා නැත්පත් කර තැබීම, ඒ ඒ නිළයන් අනුව සංඥා බසේමු අනුමැතිය පරිදි යුහ දිගු අංකයන් වෙත විවිධ පහසුකම් ලබාදීම මෙම විනිමය මගින් ඉටු කරනු ලබයි.

නවද දුරකථනයක් ක්‍රියා විරහිත වීමේදී එය කුමන ආකාරයකින් කුමන ස්ථානයකින් ක්‍රියා විරහිත වී ඇත්දැයි පරිඝණකය මගින් සොයා බලා දුරකථ න මාර්ඝ නඩත්තු කරුවන් දැනුවත් කිරීම මෙම විනිමය මගින් ඉටුවන තවත් සේවාවකි.

ස්වයංක්‍රීය දුරකථන හුවමාරුව

1981 වර්ෂයේ සිට ශ්‍රීලයුකාබ සෙබළියන් විසින් යුහමු දුරකථන හුවමාරුවේ සහ එච් එෆ් ගුවන් විදුලි පාලන ජාලයේ රාජකාරී ඉටු කරනු ලබයි. මෙහිදී කාන්තා සෙබළියන් අතින් ඉටුවනුයේ" රාජකාරියේ යෙදී සිටින

ජයසිකුරු ක්‍රියාන්විතයෙහි සංඥා සම්බන්ධතාවය

එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් නිසා ද්විඛණ්ඩනය වී තිබූ කිලිනොච්චි - වවුනියා අතර ප්‍රධාන සැපයුම් මාර්ගයෙහි බලය තහවුරු කිරීම වස් තීරණාත්මක සහ ඓතිහාසික 'ජයසිකුරු' ක්‍රියාන්විතය 1997.05.13 දින ආරම්භ විය.

මෙම ක්‍රියාන්විතය ආරම්භයේදී 53 වන සේනාංකය එක් පෙරමුනකද 55 වන සේනාංකය තවත් පෙරමුනකද සිට සටන දියත් කල අතර, මෙහි සංඥා සම්බන්ධතාවය සැපයීම සහ සම්බන්ධීකරණය කිරීම ඉතාමත් බැරෑරුම් කාර්යයක් විය. සියලුම සංඥා රෙජිමේන්තු වල නිළධාරීන් සහ කොනොනින් මෙන්ම සංඥා සෙබලුන් එකාමෙන්ම අප්‍රතිහත ධෛර්යයකින් යුතුව යථෝක්ත ක්‍රියාන්විතය සාර්ථක කරගැනීම සඳහා උරදුන්හ. එම නිසා අඛණ්ඩ සංඥා සම්බන්ධතාවයක් නිවැරදිව ගෙන යාමට මහත් රුකුලක් ලැබින.

මූලිකව ගුවන් විදුලි යන්ත්‍ර මගින් සම්බන්ධතාවය පිහිටවූ අතර, පසුව දුරකථන සම්බන්ධතාව දක්වා දිගු කිරීම හේතුවෙන් ක්‍රියාන්විතයෙහි පණිවුඩ හුවමාරුව ක්ෂණිකව සිදුකිරීමට හැකිවීම සේනාංක බලසේනා සහ බලඇණි වල ජයග්‍රාහී අඩිතාලමක සාර්ථක පසුබිමක් විය. ප්‍රථමයෙන් මඩුකන්ද ප්‍රතිවිකාශණ මධ්‍යස්ථානය හරහා ගුවන් විදුලි සම්බන්ධතාවයත් දුරකථන සම්බන්ධතාවයත් සේනාංක බලසේනා මට්ටම දක්වා ලබාදීම සිදුකල අතර පසුව ජංගම ඇන්ටනා කුළුණු ආධාරයෙන් ජංගම ප්‍රතිවිකාශණ මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංඥා සම්බන්ධතාවය දීර්ඝ ප්‍රදේශයක් දක්වා විහිදුවාලීමට හැකිවිය. සේනාංක සහ බලසේනා මූලස්ථාන මට්ටම දක්වා රේඩියෝ රිලේ පද්ධති රේඩියෝ දුරකථන උපකරණ පද්ධති ආධාරයෙන් දුරකථන පහසුකම් ලබාදීමට හැකිවීම, යුද පිටියේ සිටින සෑම නිළයකුගේම රාජකාරීමය සහ පුද්ගලික අවශ්‍යතාවයන් උදෙසා ඉමහත් ප්‍රතිඵලදායී පනිවිඩ සේවාවක් වූ අතර එය සැමගේ චිත්ත ධෛර්ය උසස් මට්ටමක පවත්වා ගැනීමට හේතු සහගත කාරණයක් විය.

ජයසිකුරු මෙහෙයුමට 56 වන සේනාංකය එක්වීමෙන් සිදුවූ බලසේනා සහ බලඇණි ව්‍යාප්තියත් සමග දුරකථන සම්බන්ධතාව පුලුල් කිරීමට ඇතිවූ අවශ්‍යතාව සපුරාලීම වස් නව දුරකථන හුවමාරුවක් 56 සේනාංක මූලස්ථානයේ ස්ථාපනය කොට මඩුකන්ද හුවමාරුව හා ඒකාබද්ධ කිරීමෙන් වැඩි දුරකථන දිගුවන් සංඛ්‍යාවක් ලබාදීමෙන් සංඥා සම්බන්ධතාව තව දුරටත් විධිමත් කරන ලදී.

1997.06.10 දින තාන්ඩිකුලම් 55 සේනාංකයෙහි ඉදිරි ක්‍රියාන්විත මූලයට එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙහිදී සංඥා නිළධාරීන් සහ සෙසුනිළයින් සිදුකල මෙහෙවර නිසා ප්‍රහාරය මධ්‍යයේ වුවද අඛණ්ඩ සංඥා සම්බන්ධතාවයක් පසුමූලයන් සමඟ පවත්වාගැනීමට හැකිවූ අතර, එමගින් ලද සහයෝගය නිසා එම මූලය ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට හසුනොවී රැකගැනීමට ඉමහත් රුකුලක් විය. මෙහිදී ත්‍රස්තවාදීන්ට එරෙහිව ප්‍රතිප්‍රහාර දියත් කිරීම සඳහා සංඥා නිළයින්ද එක්වීමෙන් ඔවුන්ගේ රණකාමී නිපුනත්වය ඔප්පු කරන ලදී. මෙහිදී ඇතිවූ දරුණු ගැටුම් වලින් ජෙකොනොනියෙකු ඇතුලු සෙනින් 05 දෙනෙකු සටනේදී ජීවිතක්ෂයට පත්වූ අතර, තවත් සෙනින් 07 දෙනෙකුට තුවාල සිදුවිය.

ඉන් අනතුරුව පෙරියමඩු ප්‍රදේශයේ ස්ථාපිත 553 බලසේනා මූලස්ථානයට සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයේදී සංඥා නිලයින්ගේ ඥාණාන්විත ක්‍රියා හේතුවෙන් විශාල සංඥා උපකරණ තොගයක් ත්‍රස්තවාදීන්ට අත්පත් කරගැනීමට තිබූ අවකාශය ව්‍යවර්ථ විය.

1997.10.15 දින කරප්පකුට්ටි ප්‍රදේශයේ ස්ථාපිත 53 සේනාංක ඉදිරි ක්‍රියාන්විත මූලයට සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයේදී ජංගම ගුවන් විදුලි ප්‍රතිවිකාශණ මධ්‍යස්ථානයන් වෙත එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හමුවේ අභීතව හා කාර්යශීලීව මුහුණ දුන් සංඥා නිලයින් එම ප්‍රතිවිකාශණ යන්ත්‍ර වල අඛණ්ඩ ක්‍රියාකාරීත්වයක් පවත්වා ගැනීමෙන් සිදුවීමට ඉඩතිබූ විශාල හානියක් වලක්වා ගැනීමට දායක විය.

වසරකට අධික කාලයක් මුළුල්ලේ සංඥා නිළධාරීන් සහ සෙසුනිළයින් මෙම ක්‍රියාන්විතයේදී පවත්නා දුෂ්කරතා මධ්‍යයේ ඉමහත් පරිශ්‍රමයකින් සහ වගකීමකින් යුතුව ඉටු කරනු ලබන මෙහෙවර ඉතාමත් සාඩම්බරව අගය කල යුතු කාරණයකි. මෙම තීරණාත්මක යුද මෙහෙවර උදෙසා ඔවුනට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

5 ශ්‍රීලංසංබ ආධාරක බළඇණියේ පස්වසරක ගමන්මග

ලුතිනන් කර්නල් ඊපීද ඉසෙඩ් අබේසේකර ප්‍රථම අණදෙන නිලධාරි ලෙස සම්මාන පෙළපාලිය පිරික්සමින්

5වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය (ආධාරක බළඇණිය) මව්බිමේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය උදෙසා අනුපමේය වූ අමිල සේවයක් ස්ථිරසාර මෙහෙවරින් ඇප කැප වෙමින් සිය අපරාජිත පස් වෙනි වසරද සාර්ථකව පරිපූර්ණත්වයට පත් කරමින් සිටී.

සිරිලක පුරා සාමය ඇතිකර ලීමෙහි ලා එල්ටීටීඊ ත්‍රස්ත බලවේගයන් මර්ධනය කිරීමේ ඒකායන අරමුණින් යුතුව 1,2,3 හා 4 වන රෙජිමේන්තු වලට අයත් නිළධාරින්ගේ සහ සෙසු නිළයින්ගේද එකමුතුකීමින් වර්ෂ 1994 ක් වූ ජනවාරි මස 02 වන දින දේවනුව යුද හමුදා කඳවුර සිය නිජබිම කරගනිමින් ජනිත වූ මෙම බළඇණිය තමන්ගේ පසුමුලය පනාගොඩ යුධ හමුදා ජනපදයේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය ආශ්‍රිතව පිහිටුවා ගන්නා ලදී.

ආරම්භක අණදෙන නිළධාරි වශයෙන් ලුතිනන් කර්නල් ඊපී ද ඉසෙඩ් අබේසේකර විශාල වගකීමක් සියතට ගෙන තම කාර්ය මණ්ඩලය සමග සියළුම අභියෝගයන්ට මුහුණ දී වසරකට වැඩි කාලයක් සේවය කල අතර, එම අතරවාරයේ මෙම ආධාරක බළඇණිය දේවනුව යුධ හමුදා කඳවුරින් නැගෙනහිර පළාතේ ප්‍රනාති ප්‍රදේශයට ගෙනඑන ලදී. අනතුරුව 23 වන සේනාංකයට අයත් නැගෙනහිර කෝරළේ පත්අවේ 232 වන බළසේනාව යටතේ වාලච්චේන ආශ්‍රිත ප්‍රදේශයෙහි කොටිත්‍රස්තවාදය මැඩලීමේ භාරධූර කර්තව්‍යයෙහි නියැලෙමින් මඩකළපුව ප්‍රධාන සැපයුම් මාර්ගය දුම්රිය මාර්ගය හා තදාසන්න කොටි බලප්‍රදේශ සියල්ල සිය අණසක යටතට ගෙනඒමෙන් කොටි ත්‍රස්තවාදීන්ගේ දෛනික පාලන කටයුතු පවා අඩාලත්වයට පත්කොට තිබේ.

සමාරම්භක අණදෙන නිළධාරි තුමා සිය රාජකාරින් 95.06.08 වන දින නව අණදෙන නිළධාරි ලෙසින් පත්ව ආ ලුතිනන් කර්නල් එච්එම්එච්ඒ හේරත් පීඑස්සී එම්එස්සී වෙත භාරදීමෙන් අනතුරුව වූ කාලය අලදී ද කොටි ත්‍රස්තවාදීන් නොසැහෙන අන්දමින් පසුබැසගිය අතර, සංඥා බළකායේ ස්ථිර ත්ෂණික ආදර්ශ සටන් පාඨය මෙහෙහි කරගත් මෙම බළඇණියේ දේශමාන්‍ය හටපිරිස් දැඩි ආක්‍රමණශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සතුරන් වෙත ප්‍රහාරයන් එල්ල කලහ.

මෙම වකවානුව අල සිය දෙවන උපන්දිනයද ඉතා ඉහලින් සැමරූ 5 වන සංඥා රෙජිමේන්තුව මව්බිම වෙනුවෙන් ගෙනගිය ප්‍රතිපත්තිය දක්ෂ අන්දමින් ඉදිරියටම ගෙන ගියේය. අණදෙන නිළධාරි තුමා 4 වන සංඥා රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි වශයෙන් පත්ව යෑමෙන් පසුව 96.06.27 දින අණදෙන නිළධාරි ලුතිනන් කර්නල් සේඑම් නවරත්න - යූඑස්පී විසින් බළඇණිය භාරගන්නා ලද අතර, එතෙක් දුරට ගෙන ආ ක්‍රියා මාර්ගයන් වැඩිදියුණු කරමින් සතුරාගේ පසුබැසීමට පහසු නවමං ඉදිකොට ප්‍රදේශයෙහි ආරක්ෂක කටයුතු උදෙසා දැඩි කැපවීමකින් කටයුතු කරමින් බළඇණියෙහි ධෛර්යය තව තවත් වර්ධනය කරන්නට විය.

මෙලෙසින් සුරුවුන්, මිලේච්ඡ වූත් ත්‍රස්තවාදය කාලයක් සමඟින් ඈතින් ඈතට පලවාහරිමින් ශ්‍රීලංකා සංඥා බලකා පවුලේ අ මණ්ඩලේශ්වර 5 වන සංඥා කුමරු සිය අභිමානවත් තෙවන හා සිව්වන සංවත්සරයන්ද උසස් මට්ටමින් සමරන්නට විය. ඉතාමත් කාර්ය බහුල අවධියක වුවද වාමි, අර්ථවත් අන්දමින් සංවත්සරයන් සැමරීමට ඒකකය සිරණය කාලේ ලත්මවගේ සාමය උදෙසා කිසියම් පරිත්‍යාගයක් කල පිරිසක් හා උදාර සේවයක් ඉටුකරමින් සිටින පිරිසක් නියාවෙනි. ඒකකයේ දිවිපිදූ සියළුම රණවිරුවන්ට හා සියළුම නිළයින්ගේ පවුල්වල මියගිය ඥාති හිතමිත්‍රාදීන් හට පිංපෙත් පැමිණවීමද තුවාල ලබා සිටින හා සේවයේ නියුතු සැමට සෙත්පැතීම සහ මව්බිමට සාමය පැතීමද අරමුණු කරගත් උත්සව රැසක් ඒ වෙනුවෙන් පවත්වන්ට යෙදිනි.

මේ අතර 98.01.05 දින වර්තමාන අණදෙන නිළධාරි මේජර් ඊආර් සමරසිංහ විසින් බළඇණිය භාරගැනීමෙන් පසුව ඒකකයේ සියළුම ක්‍රියාකාරකම් ඉතාමත් සූක්ෂම උපක්‍රමශීලි ස්වරූපයක් ගනිමින් ඉදිරියට යන්නට විය. බළඇණිය කාලෝචිත නූතන යුධෝපක්‍රමයන් දෙසට නැඹුරුවීම මෙම වකවානුව අල ඇතිවූ සැළකිය යුතු ලක්ෂණයකි.

ද්‍රවිඩ ඊලාම් කොටි ත්‍රස්තවාදීන්ගේ රජදහනක්ව පැවති මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේන, ජේතාලේ, කල්කුඩා, කල්මාඩු, කුඹුරුමුල්ලෙයි, කිරාන්, කින්නිඅඩි, මීරාවොඩෙයි සහ තදාසන්න ප්‍රදේශයන් සංඥා බළකායේ 5 වන ආධාරක බළඇණිය භාරගැනීමෙන් පසු ත්‍රස්තවාදීන් හට ප්‍රබල තර්ජනයන්ට මුහුණපෑමට සිදුව ඇති බව අවධාරණයෙන් ප්‍රකාශ කරනු කැමැත්තෙමි. සෙබළුන් විශාල ප්‍රමාණයකගේ දේශානුරාගි ප්‍රාණවායුව වාතලයට මුසුවූ මෙම ප්‍රදේශයන් තුල වර්තමානයේ යුධ හමුදාව යටතේ මනා පාලනයක් ඇතිවීමට මූලික හේතුන්වී ඇත්තේ පැහැදිලි නායකත්වය, සියළුම නිළයින්ගේ එකමුතුකම හා දැඩි උපක්‍රමිකභාවය යන කරුණුවල සම්බන්ධතාවයයි. එසේ නොවන්නට මෙම බළඇණියේද අතිවිශාල පිරිසකට තම ජීවිත පූජාකිරීමට සිදුවනු නොඅනුමානයි. මෙම බළඇණියේ මෙතෙක් රටදැය උදෙසා දිවිදුන් රණවිරුවන් ගණන 71 කි. සටනේදී තුවාල ලද රණවිරුවන් ගණන 63 කි. එමගින් ඉහත දී සම්බන්ධතාවයේ අගය හා ක්‍රියාකාරීත්වය අපහට මනාව කියාපායි.96.02.24 දින කින්නිඅඩි යුධ හමුදා කඳවුරට හා 95.07.27 දින කල්මාඩු යුධ හමුදා කඳවුරට ත්‍රස්තවාදීන් එල්ලකල දැවැන්ත ප්‍රහාරයන් සාර්ථකව මැඩලීමද 95.07.29 දින ත්‍රස්තවාදීන් විසින් මුකුරාල් යුධ හමුදා කඳවුර වෙත දැවැන්ත ප්‍රහාරයදියත් කිරීමට ප්‍රථම උපක්‍රමිකව කඩුරා අත්හැරදැමීමට හැකිවීමද 5වන සංඥා රෙජිමේන්තු ඉතිහාසයේ කැපී පෙනෙන ජයග්‍රහණයන්ය. ඊටත් වඩා මේතාක් කාලයක් විශාල හටපිරිසකගේ වටිනා ජීවිත රැස රැකගනිමින් ඉදිරියට පැමිණීමට අවකාශ ලැබීමද අපගේ විජයග්‍රහනයන් ලෙස හැදින්විය හැකිය.

හදිසි අවස්ථාවන්හිදී වෛද්‍ය පහසුකම් සැළසීම, ගම්මාන සඳහා විදුලි පහසුකම් ලබාදීම, සුදුසු ආරක්ෂිත ප්‍රදේශයන්හි ධීවර කර්මාන්තයට ඉඩ සළසාදීම හා ඔවුන්ට ආරක්ෂාව ලබාදීම, ආගමික උත්සව පැවැත්වීමට අවශ්‍ය නොයෙකුත් සහය ලබාදීම, සටන් පවතින අවස්ථාවන් හිදී අනුගමනය කල යුතු ආරක්ෂක පිළිවෙත් කියාදීම හා විපත් අවස්ථාවලදී පිහිටවීම ආදිය හේතු කොටගෙන ප්‍රදේශවාසීන් ද අප හා කිසියම් සම්බන්ධතාවයක් හා විශ්වාසයක් ගොඩනගාගෙන ඇත.

මේ අයුරින් රාජකාරියෙහි නියැලී සිටින සියළුම සෙනින් සිය පුහුණුවීමේ කටයුතු වලද නිසි පරිදි යෙදේ. යුධ හමුදා සරඹ හා එදිනෙදා ප්‍රයෝජනවත් රණබිම් ක්‍රම සහ විවිධ යුධෝපායන් නැවත නැවතත් මතකයට නගාගැනීමත් හමුදා විනය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් ඉවහල් වන පරිදි පුහුණුවීමේ දිනයන් සැම සතියකටම වරක් පවත්වන අතර, සියළුම අයවළුන්හට සතියක සංස්කරණ පාඨමාලාවන්ද බළඇණිය තුල පවත්වාගෙන යමින් සිටී. එසේම විශේෂ ප්‍රහාරක බණ්ඩ, උසස් පාබල බණ්ඩ, බළඇණි ආධාරක අවි හා නායකත්ව ආදී පාඨමාලාවන්ට බණ්ඩ හා සෙනින් යෙදවීම මෙන්ම නිළ උසස්කිරීමේ පාඨමාලාවන්ද සංඥා වෘත්තිය පාඨමාලාවන්ද අඛණ්ඩව පවත්වාගෙන යනු ලබති. සෙනින්ගේ ක්‍රීඩා කොශල්‍ය නගාසිටුවීමේ කර්තව්‍යය අදියර කිහිපයකින් සිදුවෙමින් පවතින අතර, ඒකක සුභසාධන ක්‍රියාවලියද පුළුල් කෝණයක් ඔස්සේ ව්‍යාප්ත වෙමින් පවති.

ශ්‍රී ලංකාද්වීපයේ ඒකීයභාවය, ස්වාධිපත්‍යය හා භෞමික අඛණ්ඩතාවය රැකීම උදෙසා ස්ථිරසාර මෙහෙවරින් ජාතියට උරදෙන බළඇණියේ අණදෙන නිළධාරි ඇතුළු සියළු නිළයින්ගේ අමිල සේවය මෙහිලා විශේෂයෙන් සඳහන් කල යුතුය. පැසසිය යුතුය. සුපුරුදු ආරක්ෂක ක්‍රියාකලාපයෙහිම නොසිට උද්වේගකාර ආක්‍රමණශීලි ක්‍රියා පිළිවෙතට අවතීර්ණ වී ඉන්ද්‍රසැර වැනි මෙහෙයුම් වලද යෙදෙමින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පිහිටි මෙම ප්‍රදේශයන්හි සිටින ත්‍රස්තවාදීන්ගේ බල කඳවුරු විනාශ කොට ඔවුන්ගේ විජලවිය ක්‍රියාදාමයන් බිඳලා එඩිතරව බලය පවත්වා ගනිමින් ඉතිහාසගත රිවිරැස , ජයසිකුරු වැනි මෙහෙයුම් වලටද පහසුවන පරිදි නැගෙනහිර ප්‍රදේශය රැකගැනීම මුළුමහත් ලාංකික ජාතියම අගයනු ඇත.

ක්‍රියාත්විත ප්‍රදේශයක ජීවිත කාලය කැපකරමින් ලක්මවගේ සාමය වෙනුවෙන් සටන් මගට පිළිපන් ශ්‍රී ලංකා සංඥා බළකායේ පෙරමග ජය නිසැකය. එසේම එමගින් ලබන අත්දැකීම් සම්භාරය සැමටම ආනන්ද ජනක විශ්‍රාමයක් වන අතරම ඉන් ජාතියට ජවයක්ද ලැබෙනු නොඅනුමානය.

ලුතිනන් එන්පී අනුරාධ මෙන්ඩිස් විසිනි

විදුලිය හා ඒ ආශ්‍රිත කරුණු

එදිනෙදා ජීවිතයේදී අප විසින් පරිහරණය කරනු ලබන බොහෝ දෑ විදුලිය ආශ්‍රිතව පවතී. ආහාර හා ජලය මිනිසාගේ ජීවිතයට අත්‍යවශ්‍ය අංගයක් වන්නා සේම මිනිසාගේ පැවැත්මට විදුලියද අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. එබැවින් මෙම අවිද්‍යාමාන බලය පිළිබඳ කරුණු සොයා බැලීම වැදගත් වේ.

විදුලිය යනු කුමක්ද ?

මෙයට පිළිතුරු සොයා ගැනීම සඳහා එයට මුල් වන හේතු කාරක සොයා බැලිය යුතුය. අප ජීවත් වන්නා වූ විශ්වය නිර්මානය වී ඇත්තේ කොටස් දෙවර්ගයකිනි. එනම්, ද්‍රව්‍යමය කොටස හා ද්‍රව්‍යමය නොවන කොටස් දෙවර්ගයයි. ද්‍රව්‍යමය කොටස පදාර්ථ (MATTER) ලෙසත් ද්‍රව්‍යමය නොවන කොටස ශක්තිය (ENERGY) ලෙසත් දැක්වේ. විදුලිය අයත් වන්නේ ද්‍රව්‍යමය නොවන සණයටයි. එබැවින් එය ශක්තියකි. ඕනෑම ශක්තියක් වෙනත් ශක්තියකට පරිවර්ථනය කල හැක. විදුලිය මගින් ලබා ගන්නා තාපය, ආලෝකය හා ශබ්දය වැනි ශක්තීන් මෙ සඳහා නිදසුන් සේ දැකිය හැක.

ද්‍රව්‍යමය නොවන පදාර්ථ සෑදී ඇත්තේ මූල ද්‍රව්‍ය වලිනි. මූල ද්‍රව්‍යයක් යනු එහි ආරම්භක ද්‍රව්‍යයට වඩා වෙනත් සරල අවස්ථාවකට රසායනික හෝ වෙනත් ක්‍රමයකින් පත්කල නොහැකි ද්‍රව්‍යයකි. විශ්වයෙ දැනට මූල ද්‍රව්‍ය සියයට වැඩි ගණනක් ඇත. මූල ද්‍රව්‍යයන් ඝණ, ද්‍රව හා වායු ලෙස දැකිය හැක.උදාහරණයක් වශයෙන් යකඩ, තඹ, රත්‍රරන්, රසදිය හා හයිඩ්‍රජන් , ඔක්සිජන් වායු මූලද්‍රව්‍ය සේ දැකිය හැක. සෑම මූල ද්‍රව්‍යයක්ම සෑදී ඇත්තේ මූල ද්‍රව්‍ය පරමාණු එක්වීමෙනි. මූලද්‍රව්‍යයක පරමාණුවක් යනු එහි තවදුරටත් බෙදිය නොහැකි ඉතාම කුඩා අංශුව වේ. මේ අනුව සෑම මූලද්‍රව්‍යයකටම ආවේනික වූ පරමාණුවක් ඇත. එමෙන්ම ඒ සඳහා ස්කන්ධයක් හෙවත් බරක් ඇත. එක් එක් මූලද්‍රව්‍යයන් වල පරමාණුක ස්කන්ධය එකිනෙකට වෙනස් වේ. මේ නිසා පරමාණුක ස්කන්ධය මත මූලද්‍රව්‍යයන් වර්ග කොට ඇත.

මූල ද්‍රව්‍ය පරමාණුවක ස්වභාවය පිළිබඳ නොයෙක් මත හා තර්ක විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරනු ලදුව දැනට පිළිගැනෙන ස්වභාවය මතු දැක්වෙන පරිදි වේ. මූලද්‍රව්‍ය පරමාණුවක ප්‍රධාන කොටස් 3 ක් ඇත. ඒවා ප්‍රෝටෝන (PROTON) නියුට්‍රෝන (NUYTRON) හා ඉලෙක්ට්‍රෝන (ELECTRON) ලෙස හැඳින්වේ. මින් ප්‍රෝටෝන සඳහා ධන විද්‍යුත් ආරෝපනද ඉලෙක්ට්‍රෝන සඳහා ඍණ විද්‍යුත් ආරෝපනද නියුට්‍රෝන සඳහා ආරෝපණයක් නොමැති බවද පැවසේ. ඕනෑම මූලද්‍රව්‍ය පරමාණුවක එයට අයත් ප්‍රෝටෝන ගණනට සමාන ඉලෙක්ට්‍රෝන ගණනක් ඇත. නියුට්‍රෝන ප්‍රමාණය ප්‍රෝටෝන ගණනට සමාන වන හෝ නොවන අවස්ථාද ඇත. ප්‍රෝටෝන මගින් සෑම විටම ඉලෙක්ට්‍රෝන වෙත ආකර්ශණ බලයක් ඇත. ප්‍රෝටෝන හා නියුට්‍රෝන පරමාණුවේ මධ්‍ය කොටසෙහි ඇති අතර එය ඉතාමත් ශක්තිමත් කොටසකි. මෙය පරමාණුවේ න්‍යෂ්ටිය (NUCLER) ලෙස හැඳින්වේ. එයට අයත් ඉලෙක්ට්‍රෝන පරමාණුවේ න්‍යෂ්ටිය වටා නිශ්චිත හැඩයක් නොමැති පථ ඔස්සේ පරිභ්‍රමණය වෙමින් පවතී. මේ නිසා යම් යම් අවස්ථාවන් වලදී ඉලෙක්ට්‍රෝන වලට පරමාණුවෙන් ඉවත්වී ඉවතට යා හැකි අතර ප්‍රෝටෝන සඳහා එවැනි අවස්ථාවක් නොමැත. යම් පරමාණුවක ඉලෙක්ට්‍රෝන ඉවත් වී ගොස් එහි නියමිත ප්‍රමාණයට වඩා ඉලෙක්ට්‍රෝන ඌණතාවයක් ඇතිවුවහොත් එවැනි පරමාණුවක් ධන ආරෝපිත පරමාණුවක් ලෙසද යම් පරමාණුවකට එහි නියමිත ඉලෙක්ට්‍රෝන ප්‍රමාණයට වඩා වැඩි ඉලෙක්ට්‍රෝන ප්‍රමාණයක් පිටතින් එක්වී ඉලෙක්ට්‍රෝන අතිරික්තයක් ඇති වුවහොත් එවැනි පරමාණුවක් ඍණ ආරෝපිත පරමාණුවක් ලෙසද හැඳින්වේ. ඕනෑම මූලද්‍රව්‍ය පරමාණුවක් සැමවිටම උත්සාහ ගන්නේ උදාසීනව පැවතීමටය. එනම් ආරෝපිත බවින් තොරව පැවතීමටයි.



පරමාණුවක ඇති ඉලෙක්ට්‍රෝන යම් ආකාරයකින් එහි න්‍යෂ්ටිය වෙත ඇති ආකර්ශණ බලයෙන් මිදී ඉවත් වීමේදී යම් ශක්ති විපර්යාසයක් සිදුවේ. මෙම සිදුවන ශක්ති විපර්යාසය විද්‍යුත් ශක්තිය ඉපද වීමට මුල්වන ප්‍රධාන සාධකයයි. පරමාණුවල ඇති ඉලෙක්ට්‍රෝන ඉවත් කර ගැනීම ආකාර කිහිපයකින් සිදුකල හැක. එනම් පරමාණු අතර ගැටීම් ඇති කිරීම, එහි උෂ්ණත්වය වැඩි කිරීම හෝ බාහිරයෙන් යොදනු ලබන ඉලෙක්ට්‍රෝන පීඩන මගින් මූලද්‍රව්‍ය පරමාණු වල ඉලෙක්ට්‍රෝන ඉවත් කල හැක. මෙලෙස මූලද්‍රව්‍ය පරමාණු වලින් ඉලෙක්ට්‍රෝන ඉවත් කරගැනීමෙන් උත්පාදනය වන විද්‍යුත් ශක්තිය ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට වෙන් කෙරේ. ඒවා ස්ථිති විදුලිය (STATIC ELECTRICITY) හා ධාරා විදුලිය (CURRENT ELECTRICITY) ලෙස හැඳින්වේ. නොයෙකුත් වස්තූන් මත ඇති ඉලෙක්ට්‍රෝන එම වස්තූන් අතර ඇතිවන ගැටීම් වලදී ඉවත් වීම නිසා ස්ථිති විදුලිය ඇතිවේ. එමෙන්ම බාහිර ඉලෙක්ට්‍රෝන පීඩනයන් ඇති කිරීමෙන් යම් යම් වස්තූන්හි ඇති ඉලෙක්ට්‍රෝන ඉවත් කර ගැනීමේදී ඇතිවන විද්‍යුත් ශක්තිය ධාරා විදුලිය ලෙස හැඳින්වේ.

ස්ථිති විදුලිය (STATIC ELECTRICITY)

ස්ථිති විදුලිය නොයෙකුත් වස්තූන් මත ඇතිවිය හැකි අතර එය යම් තැනකට සම්ප්‍රේශණය කිරීමෙ හැකියාවක් නැත. මෙය ඇතිවන්නේ යම්කිසි වස්තූන් දෙකක් එකිනෙකට ගැටීමේදී හෝ පිරිමැදීමේදී එක් වස්තුවක පිහිටි මූලද්‍රව්‍ය පරමාණුවල ඉලෙක්ට්‍රෝන වලින් කොටසක් ඉන් ගිලිහී ගොස් අනෙක් වස්තුවෙහි ඇති මූලද්‍රව්‍ය පරමාණුවක තැන්පත් වීමයි. එසේ වීමේදී වස්තූන් දෙකෙහිම මූල ද්‍රව්‍ය පරමාණුවල ස්ථායීතාව බිඳ වැටී ආරෝපිත වස්තූන් බවට පත් වේ. මෙහිදී ඉලෙක්ට්‍රෝන ඉවත් වූ වස්තුවට ධන විද්‍යුත් ආරෝපිත භාවයකුත් ඉලෙක්ට්‍රෝන ලබාගත් වස්තුව ඍණ විද්‍යුත් ආරෝපිත භාවයකුත් ලබාගනී. එවැනි ආරෝපිත වස්තූන් හට යම් කාර්යයක් කිරීමෙ හැකියාවත් ඇත. මේ සඳහා එදිනෙදා ජීවිතයේදී අපට නොයෙකුත් නිදසුන් දැකගත හැක. ස්ත්‍රික්කයක්

ආධාරයෙන් ලෝම වලින් හෝ පොලියෙස්ටර් වලින් නිම කරන ලද ඇඳුම් මැදීමෙන් පසු ඇඟලීමට යාමේදී ශරීරයේ ඇති රෝම කූප මත යම් බලපෑමක් ඇතිවන බව ඔබ දැක ඇත. මෙහිදී සිදුවන්නේ ස්ත්‍රික්කය රෙදිමත ගැටීමේදී එහි මූල ද්‍රව්‍ය පරමාණුවල ඉලෙක්ට්‍රෝන වලින් කොටසක් ගිලිහී ගොස් රෙදි මත තැන්පත් වීම නිසා ස්ත්‍රික්කය හා රෙදි මත විද්‍යුත් ආරෝපිත තත්වයක් ඇතිවීමයි. එසේ ඇතිවන විද්‍යුත් ආරෝපිත ස්වභාවය ඉක්මනින් උදාසීන වීමට යත්න දරන නිසා ඉහත සඳහන් සංසිද්ධිය ඇතිවේ. මෙවැනි සිදුවීම ස්වභාවිකවද ඇතිවේ. විදුලි අකුණු ඇතිවීම එවැනි අවස්ථාවක උදාහරණයකි.

ඉලෙක්ට්‍රෝන ඉවත් වීමෙන් ධන ආරෝපිත බවට පත්වේ



ගැටීමේදී හා පිරිමැදීමේදී එක් වස්තුවකින් තවත් වස්තුවක් කරා ඉලෙක්ට්‍රෝන ගමන් ගනී.

ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමෙන් සෘණ ආරෝපිත තත්වයට පත්වේ

වායු ගෝලයේ ඇති වලාකුළු නිර්මාණය වී ඇත්තේ දූවිලි අංශු වැනි දෑ වටා ජල වාෂ්ප ඝණීභවනය වීමෙනි. මේවා විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතී. අධික සුළං හමන අවස්ථාවකදී මේවා වේගයෙන් ඔබ මොබ පාවී යයි. එවැනි අවස්ථාවකදී එක් වලාකුළු කණ්ඩයක් තවත් වලාකුළු කණ්ඩයක් මත ගැටී පාවී යාහැක. එවැනි අවස්ථාවකදී එක් වලාකුළු කණ්ඩයක ඇති මූලද්‍රව්‍ය පරමාණුවල ඉලෙක්ට්‍රෝන කොටසක් ගිලිහී ගොස් අනෙක් වලාකුළු කණ්ඩයෙහි ඇති මූලද්‍රව්‍ය පරමාණුමත තැන්පත් විය හැක. මේ හේතුවෙන් වලාකුළු කණ්ඩයේ විද්‍යුත් ආරෝපිත තත්වයක් ඇතිවේ. එසේ ආරෝපිත වූ වලාකුළු සෑම විටම උදාසීන අවස්ථාවේ පැවතීමට යත්න දරණ නිසා එකිනෙකට ප්‍රතිවිරුද්ධ එනම් ධණ හා සෘණ ලෙස ආරෝපිත වලාකුළු දෙකක් එකිනෙකට ආසන්න වූ විට ක්ෂණයකින් ඉලෙක්ට්‍රෝන අතිරික්තයක් පවතින වලාකුළු කණ්ඩයේ සිට ඉලෙක්ට්‍රෝන ඌණතාවයක් තිබෙන වලාකුළු කණ්ඩය වෙතට ඉලෙක්ට්‍රෝන ඉවත් කිරීමක් සිදුකිරීමෙන් පසු වලාකුළු කණ්ඩ දෙකම උදාසීන තත්වයට පත්වේ. මෙම ක්‍රියාවලිය විද්‍යුත් ආරෝපන විසර්ජනය (DISCHARGE) ලෙස හැඳින්වේ. මෙවැනි විසර්ජනයකදී විශාල විද්‍යුත් ශක්තියක් උපදී. එය වෙනත් ශක්තීන්ට පරිවර්තනය වී ශබ්දය, තාපය හා ආලෝකය ලෙස අපට දැකිය හැක.



වලාකුළු අතර ඇතිවන විසර්ජනය



පෘථිවිය සමඟ ඇතිවන විසර්ජනය

ආරෝපිත වලාකුළු අතර මෙලෙස ඇතිවන විසර්ජනය වලාකුළු කණ්ඩ දෙකක් අතර පමණක් නොව වලාකුළු කණ්ඩයක් හා පෘථිවි තලය අතරද සිදුවිය හැක. පෘථිවි තලය සෑම විටම විද්‍යුත් වශයෙන් උදාසීන වස්තුවක් ලෙස සැලකේ. යම් වස්තුවක් මත ඇති අතිරික්ත ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමට හෝ ඉලෙක්ට්‍රෝන ඌණතාවයක් පවතින වස්තුවක් මතට අවශ්‍ය ඉලෙක්ට්‍රෝන ප්‍රමාණය ලබාදීමට පෘථිවියට හැකියාවක් ඇත. මේ නිසා විද්‍යුත් ආරෝපිත වලාකුළු පෘථිවියට ආසන්නම අවස්ථාවන් හිදී ආරෝපණය විසර්ජනය විම පෘථිවිතලයත් සමග සිදුවේ. මෙවැනි අවස්ථාවන් හිදී විසර්ජනය සඳහා අවශ්‍ය වන ඉලෙක්ට්‍රෝන පෘථිවිය දෙසට ගෙන ඒමට හෝ පෘථිවිය දෙසට ගෙන යෑමට මාධ්‍යයක් අවශ්‍ය වේ. මෙවැනි අවස්ථාවකදී උස් ගොඩනැගිලි, කුළුණු, උස් ගස් ආදී දෑ මාධ්‍ය බවට පත්වේ. එසේ පත්වූ අවස්ථාවන්හිදී ඒවා හානියට පත්වේ. මෙවැනි අවස්ථා එදිනෙදා ජීවිතයේදී බොහෝ විට දැකිය හැක. මෙලෙස පෘථිවිය සමග ඇතිවන ආරෝපන විසර්ජනයේදී සිදුවන හානි වලක්වා ගැනීම සඳහා අප විසින් නොයෙකුත් උපක්‍රම යොදාගනු ලැබේ.



අකුණු සන්නායක්යක් යොදන ලද ගොඩනැගිල්ලක්

විදුලි අකුණු ඇතිවන අවස්ථාවන්හිදී ආදි මිනිසුන් විසින් ගෙම්දුලට අලවංගුවක් හෝ වෙනයම් ලෝහ දණ්ඩක් විසි කිරීමෙන් අකුණකින් සිදුවන හානි වලක්වා ගැනීමට පුරුදු වී සිටියහ. මෙයට හේතු වූ මූලික කරුණ නම් සාමාන්‍ය ගේ දොර ගහකොල වැනි දෑට වඩා ලෝහ වර්ග ඉලෙක්ට්‍රෝන සන්නයනයට පහසු බැවින් පෘථිවියත් සමග ඇතිවන විද්‍යුත් විසර්ජනයකදී මාධ්‍ය ලෙස ක්‍රියාකිරීමට ලෝහ දණ්ඩට වැඩි හැකියාවක් ඇත. එමගින් සිදුවන හානි අවම කර ගත හැක. නවීන විද්‍යාවට අනුව මෙලෙස පෘථිවියත් සමග ඇතිවන ආරෝපන විසර්ජනය සඳහා මාධ්‍යයක් හැටියට අකුණු සන්නායක (LIGHTNING CONDUCTOR) යොදා ගැනේ. ඔබ විසින් මේ උපකරණය බොහෝ විට දැක ඇත. මේවා විශේෂයෙන් දැගැබ්, උස්කුළුණු මත හා උස් ගොඩනැගිලි මත සවිකර ඇත. මෙය ඉතා සරල උපකරණයකි. මෙය සාදා ඇත්තේ ඉතා හොඳින් විදුලිය ගමන් ගන්නා තඹ හෝ පිත්තල වැනි ලෝහයක් භාවිතා කිරීමෙන් සාදන ලද ත්‍රිශූලයක් වැනි කොටසක් එම ලෝහයෙන්ම සාදන ලද කම්බියක් මගින් පෘථිවියට සම්බන්ධ කිරීමෙනි. විද්‍යුත් ආරෝපණ එක්රැස් වීම වැඩි වශයෙන් සිදුවන්නේ තුඩු සහිත කොටස් වලට නිසා අකුණු සන්නායකයේ කෙලවරද තුඩු සහිතව නිර්මාණය කර ඇත. තුඩු සහිත තැන්වල වැඩි ආරෝපණ ඝණත්වයක් ඇති නිසා තුඩු සහිත අතු පිහිටා ඇති ගස් වලට විදුලි අකුණු වලින් සිදුවන හානිය වැඩිය. පොල්ගස්, කිතුල් ගස් ආදී තාල වර්ගයට අයත් ගස් වලට විදුලි අකුණු වලින් සිදුවන හානි වැඩි බව අපට නිතර දැකිය හැක. තවද ආරක්ෂිත අකුණු සන්නායක නොමැති විවෘත භූමි, විශාල පිට්ටනි, කුඹුරුයායවල් වැනි තැන් වල තදින් විදුලි අකුණු ඇතිවන අවස්ථාවන්හිදී මිනිසුන් හා සතුන් ගැවසීම ඔවුනට හානි දායක විය හැක. මෙයට හේතු වන්නේ අධි විද්‍යුත් ආරෝපණ වලින් යුත් වලාකුළු වලින් පෘථිවිය හා විසර්ජනය වීමට යත්න දැරීමේදී මාධ්‍යයක් නොමැති වූ කල මිනිසුන්, සතුන් ආදීන්ද මාධ්‍යයක් ලෙස උපයෝගී වීමයි. විදුලි අකුණු වදින අවස්ථාවන්හිදී කුඹුරු යායන්, විශාල පිට්ටනි මැදින් ගමන් කරමින් සිටි මිනිසුන් හෝ සතුන් විදුලි අකුණු නිසා ජීවිතක්ෂයට පත්වී ඇති අවස්ථා අප දැක ඇත.

ඉහත සඳහන් වූයේ ස්වභාවික ලෙස උපදින ස්ථිති විදුලියත් එමගින් ඇතිවන හානි පිලිබඳවත්ය. එමගින් සිදුවන හානිය අවම කරගැනීම හෝ වැලැක්වීම සඳහා අපට මතු දැක්වෙන ක්‍රියා මාර්ග අනුගමනය කල හැක.

01. උස් ගොඩනැගිලි, දාගැබ්, කුළුණු ආදිය තැනීමේදී ඒවායේ උසම ස්ථානයේ ඉහලට සිටින සේ අකුණු සන්නායක සවිකිරීම.

02. රූපවාහිනී හෝ වෙනත් අහස් කම්බි සවිකිරීම සඳහා සැමවිටම යොදාගනු ලබන ආධාරක සඳහා සන්නායක භාවිතා කලයුතු අතර ඒවා හොඳින් පෘථිවියට සම්බන්ධ කල යුතුය.

සවිකරනු ලබන අහස් කම්බි සෑම විටම එම ආධාරක කණුවේ ඉහලම කෙලවරට පහතින් සවිකල යුතුය.

03. විදුලි අකුණු ඇතිවන අවස්ථාවන්හිදී විවෘත භූමියන්හි (ක්‍රීඩා පිටි, වෙල් යායවල්) ගැවසීමෙන් වැලකී සිටීම.

04. විදුලි රැහැන් දුරකථන මාර්ග ආදී සවිකිරීම වලදී නියමිත පරිදි අකුණු ප්‍රතිභාධක (LIGHT-NING ARRESTORS) යොදා ඒවා හොඳින් පෘථිවිගත කොට සම්බන්ධ කල යුතුය.

05. විදුලි අකුණු ඇතිවන අවස්ථාවන් හිදී ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර ආදියට සවිකර ඇති ඇන්ටනා වයරය ඒවායෙන් ගලවා ඉවත්කොට භූමිගත වන පරිදි තැබීම.

06 නිවාස ගොඩනැගිලි ආදියෙහි විදුලි රැහැන් යෙදීමේදී ඒ සඳහා යොදනු ලබන ආරක්ෂිත වයරය (EARTH WIRE) ඉතා හොඳින් භූමිගත කල යුතුයි.

ධාරා විදුලිය (CURRENT ELECTRICITY)

අප මෙතෙක් ස්ථිති විදුලිය හා ඒ ආශ්‍රිත කරුණු සොයා බැලුවෙමු. ස්ථිති විදුලියට වඩා වෙනස් ගති ලක්ෂණ ඇති විද්‍යුත් ශක්තියකි ධාරා විදුලිය. ස්ථිති විදුලිය යම් තැනක උත්පාදනය වුවත් එය අපට අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගත නොහැක. එය උත්පාදනය වීමෙන් පසු ඇතිවන ක්ෂණික විසර්ජනයකින් විනාශ වී යයි. නමුත් ධාරා විදුලිය එලෙස විනාශ නොවන්නකි. එහි ක්‍රියාකාරීත්වය බොහෝ දුරට ජලයේ ක්‍රියා කාරීත්වයට සමානය. එනම් ජලය යම් තැනක ගබඩා කොට එතැන් සිට නල මාර්ග ඔස්සේ අපට අවශ්‍ය තැනකට ගෙන යා හැකි අතර එතැන් සිට ජල කරාමයක ආධාරයෙන් අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගත හැක. ධාරා විදුලියද එලෙස යම් තැනක ගබඩාකොට හෝ නිපදවා සන්නායක කම්බි ඔස්සේ අවශ්‍ය තැනකට ගෙනගොස් යතුරක (switch) ආධාරයෙන් අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට යොදා ගත හැක.

ධාරා විදුලිය කොටස් දෙකකට වෙන් කොට ඇත. එනම සරල ධාරා (Direct Current) විදුලිය සහ ප්‍රත්‍යාවර්ථ ධාරා (Alternative Current) විදුලියයි. මෙම විදුලි ශක්තීන් දෙකම උත්පාදනය කරගනු ලබන්නේ මූල ද්‍රව්‍ය පරමාණුවක් මත ඇති කරනු ලබන ඉලෙක්ට්‍රෝන පීඩනයකදී මුක්ත වන්නාවූ ඉලෙක්ට්‍රෝන ආශ්‍රයෙනි. විදුලි ධාරාවක් යනු ඉලෙක්ට්‍රෝන ධාරාවකි. යම් සන්නායකයක් ඔස්සේ ඉලෙක්ට්‍රෝන ධාරාවක් ගලා ගියහොත් එය තුලින් විදුලි ධාරාවක් ගමන් කල බව පැවසේ. මෙසේ සන්නායකයක් තුලින් ඉලෙක්ට්‍රෝන ධාරාවක් ගමන් ගැන්වීමට භාහිරයෙන් එම සන්නායකයේ කෙලවරට ඉලෙක්ට්‍රෝන පීඩනයක් යෙදිය යුතුය. මෙසේ යම් සන්නායකයක් ඔස්සේ ඉලෙක්ට්‍රෝන ගමන් කරවීමට යොදනු ලබන ඉලෙක්ට්‍රෝන පීඩනය විද්‍යුත් ගාමක බලය (Electro Motive power) යනුවෙන් හඳුන්වනු ලැබේ.

වායු පීඩනයක් හෝ වෙනයම් පීඩනයක් මැනීම සඳහා නොයෙකුත් ඒකක භාවිතා කරන්නාසේම ඉලෙක්ට්‍රෝන පීඩනය මැනීම සඳහාද ඒකකයක් තිබේ. එය වොල්ට් (Volt) නම් ඒකකයයි. එනම්-විද්‍යුත් ගාමක බලය මනිනු ලබන්නේ වෝල්ට් වලිනි. ඉලෙක්ට්‍රෝන පීඩනයක් ඇති වීම හේතුවෙන් යම් සන්නායකයක් ඔස්සේ ගලා යන ඉලෙක්ට්‍රෝන ධාරාව විද්‍යුත් ධාරාව ලෙස හඳුන්වන අතර ඒ සඳහාද සම්මත ඒකකයක් පවතී. එය ඇම්පියර් (Ampere) නමින් හැඳින්වේ. ධාරා විදුලිය සඳහා අවශ්‍යවන විද්‍යුත් ගාමක බලය නිපදවා ගන්නා ක්‍රම බොහෝ ඇත. එනම්:

01. රසායනික ක්‍රියාවලියක් මගින්, විදුලිපන්දම් බැටරි, ඊයම් අම්ල බැටරි (Led Acid Battry) ආදී දෑ මගින් මෙම ක්‍රියාවලියට අනුව විද්‍යුත් ගාමක බලය නිපදවා ගත හැක.

02. තාපය හා ආලෝකය ආධාරයෙන්, සූර්ය තාප හා සූර්ය ආලෝක බැටරි මගින් මෙම ආකාරයට විද්‍යුත් ගාමක බලය නිපදවා ගත හැක.

03. විද්‍යුත් චුම්බක ක්‍රියාවලිය මගින්, බයිසිකල් ඩයිනමෝ, ජනක යන්ත්‍ර ආදී දෑ වලින් මේ ආකාරයට විද්‍යුත් ගාමක බලය උත්පාදනය කරගත හැක.

විදුලි ධාරාවක් ගමන් කරවීම සඳහා සන්නායක (conductor) අවශ්‍ය වේ. බොහෝ ලෝහ වර්ග සන්නායක ඝණයට වැටේ. ඒ ඒ ලෝහ වර්ග වල ස්වභාවය අනුව ඒවායේ සන්නායකතාවය වෙනස් වේ. පහත දැක්වෙන වගුවෙහි ඒ ඒ ලෝහයන්හි සන්නායකතාවය පිලිබඳ දැක්වේ.

ද්‍රව්‍යය	සන්නායකතාවය
රත්රන්	ඉතාමත් හොඳයි
රිදී	ඉතාමත් හොඳයි
තඹ	හොඳයි
ඇලුමිනියම්	හොඳයි
යකඩ	සාමාන්‍යයයි
කාබන්	සාමාන්‍යයයි

විදුලි ධාරාවක් ගමන් කරවිය නොහැකි ද කුසන්නායක (Insulator) ලෙස හැඳින්වේ. පහත දැක්වෙන වගුවෙහි ද්‍රව්‍ය කිහිපයක කුසන්නායකතාවය පිළිබඳ තොරතුරු දැක්වේ.

ද්‍රව්‍යය	කුසන්නායකතාවය
පිඟන් මැටි	ඉතා හොඳයි
වීදුරු	ඉතා හොඳයි
රබර්	ඉතා හොඳයි
දැව	සාමාන්‍යයයි
ජලය	ඉතාමත් අඩුයි

මෙලෙස එක් එක් ද්‍රව්‍යයන් හරහා ඉලෙක්ට්‍රෝන ධාරාවක් ගමන් කිරීමට ඇති හැකියාව හෝ නොහැකියාව පිළිබඳ මැනීමක් කල හැක. එය යම් ද්‍රව්‍යයක ප්‍රතිරෝධය (Resistance) ලෙස මනිනු ලබයි. ඉතාමත් හොඳ සන්නායකයන්ගේ ප්‍රතිරෝධය ශුන්‍යයට ආසන්න වේ. ඉතාමත් හොඳ කුසන්නායකයක ප්‍රතිරෝධය අනන්තයට ආසන්න වේ. සන්නායකයක හෝ කුසන්නායකයක ප්‍රතිරෝධය මැනීම සඳහාද ඒකකයක් භාවිතා කරනු ලබයි. එය ඕම්ස් (OHM) යනුවෙන් හැඳින්වේ.

විද්‍යුත් ගාමක බලයක් හේතු කොට ගෙන සන්නායකයක් තුලින් ගලා යන ඉලෙක්ට්‍රෝන ධාරාව හෙවත් විද්‍යුත් ධාරාවත් එම සන්නායකයේ ප්‍රතිරෝධයත් යන මේ මූල තුන අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ ඕම් නම් විද්‍යාඥයෙක් ඉතා වැදගත් නියමයක් ප්‍රකාශකර ඇත. විදුලිය සබැඳිව ඉදිරිපත් කර ඇති මෙම නියමය ඕම්ගේ නියමය (OHM's LAW) ලෙස හඳුන්වනු ලබයි.. මෙය ඉතා වැදගත් නියමයක් වන අතර ඉන් ප්‍රකාශ වන්නේ උෂ්ණත්වය නොවෙනස්ව පවතින අවස්ථාවක සන්නායකයක් තුලින් ගලායන විද්‍යුත් ධාරාව එහි දෙකලවර විද්‍යුත් ගාමක බලයන්හි වෙනස හෙවත් විභව අන්තරයට (Potential Difference) අනුලෝමව සමානුපාතික වන බවයි. මේ අනුව පහත දැක්වෙන සමීකරණය ඉදිරිපත් කර ඇත.

* වි. ගා. බ. අතර වෙනස
(විභව අන්තරය) = ගලායන ධාරාව x
සන්නායකයේ ප්‍රතිරෝධය
මෙය V = I x R යනුවෙන්ද බොහෝ විට දැක්වේ.

මෙහි V යනු වි. ගා. බලයන්ගේ වෙනස වන අතර I යනු ගලා යන ධාරාවත් R යනු සන්නායකයේ ප්‍රතිරෝධයත් වේ.

ඉහතින් දක්වන ලද කරුණු ප්‍රත්‍යාවර්ථ හා සරල ධාරාව යන ධාරා වර්ග දෙකටම පොදු වූවකි. සරල ධාරාවත් ප්‍රත්‍යාවර්ථ ධාරාවත් අතර වෙනස වන්නේ ධාරාව ගමන් ගන්නා දිශාවයි. සරල ධාරාව සෑම විටම නියමිත දිශාවක් ඔස්සේ ගමන් ගනී. නමුත් ප්‍රත්‍යාවර්ථ ධාරාව එසේ නොවේ. ප්‍රත්‍යාවර්ථ ධාරාව නිශ්චිත කාලාන්තරයක් තුල එය ගමන් ගන්නා දිශාව මාරු වෙමින් ගමන් ගනී. එනම් ප්‍රත්‍යාවර්ථ ධාරාව යම්කිසි සංඛ්‍යාතයක් ඇතිව ගමන් ගනී. සරල ධාරාව සඳහා එසේ සංඛ්‍යාතයක් නොමැත.



කාලයත් සමඟ ධාරාව ගමන් ගන්නා දිශාව වෙනස් නොවේ. සංඛ්‍යාතයක් නොමැත

කාලයත් සමග ධාරාව ගමන් ගන්නා දිශාව වෙනස් වේ. සංඛ්‍යාතයක් ඇත.

සාමාන්‍ය විදුලි පන්දම් බැටරියකින් හෝ ලෙඩ් ඇසිඩ් බැටරියකින් අපට සෑම විටම ලැබෙන්නේ සරල ධාරාවකි. සාමාන්‍ය බයිසිකල් ඩයිනමෝවකින් විදුලි ජනක යන්ත්‍රයකින් අපට ලැබෙන්නේ ප්‍රත්‍යාවර්ථ ධාරාවකි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් විද්‍යුත් චුම්භක ක්‍රියවලියකදී හැර අන් සෑම අවස්ථාවකදීම (රසායනික හෝ වෙනයම් ක්‍රියාවකදී) අපට ලැබෙන්නේ සරල ධාරා විදුලියයි. අප රටෙහි භාවිතාවන ප්‍රධාන විදුලිය ප්‍රත්‍යාවර්ථ ධාරාවයි. එහි සංඛ්‍යාතය තත්පරයකට චක්‍ර 50 කි. වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් ධාරාව ගමන් ගන්නා දිශාව තත්පර එකක කාලයක් තුලදී 50 වාරයක් වෙනස් වෙමින් පවතී. සංඛ්‍යාතය මැනීම සඳහා හර්ට්ස් (Hertz) නම් ඒකකය භාවිතය කරයි. එය බොහෝ තැන්වලදී Hz යනුවෙන් දක්වනු ලබයි. බොහෝ විට ප්‍රත්‍යාවර්ථ ධාරාව සඳහන් වන තැන්වල එහි විද්‍යුත් ගාමක බලය හා සංඛ්‍යාතය සඳහන් කරනු ලබයි. අප රටෙහි භාවිතා කරනු ලබන ප්‍රධාන විදුලියෙහි විද්‍යුත් ගාමක බලයෙහි අගය සාමාන්‍යයෙන් වෝල්ට් 230 කි. මේ නිසා ප්‍රධාන විදුලියෙන් භාවිතා කරනු ලබන බොහොමයක් උපකරණ වල එය 230 V/ 50 Hz යනුවෙන් සඳහන් වී ඇති ආකාරය ඔබ බොහෝ විට විදුලි උපකරණ වල දකින්නට ඇත. සමහර රටවල මෙම අගයන් වෙනස් වේ. ඒ අනුව විද්‍යුත් ගාමක බලය වොල්ට් 110 හෝ වෝල්ට් 115 වේ. එමෙන්ම සංඛ්‍යාතයද හර්ට්ස් 60 ක් වේ. මෙවැනි අවස්ථාවන්හිදී යොදාගනු ලබන විද්‍යුත් උපකරණ වල 110V/ 60 Hz හෝ 115 V / 60 Hz යනුවෙන් සඳහන් කොට ඇත. එවැනි උපකරණ වෙනොත් අප රටේ පවතින විදුලි පද්ධතිය සමග සෘජුවම භාවිතා කල නොහැකි අතර පරිවර්ථක (Converter) වැනි උපකරණයක් භාවිතා කිරීමෙන් අප රටේ භාවිතා වන විදුලිබල පද්ධතිය හා සම්බන්ධ කර ගත හැක.

ලුති (උපා) ඩබ්ඒසී විජේරත්න
සංඥා මූලික වැඩපල, පනාගොඩ

විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් සංඥා යැවීමේ උපකරණ සොයා ගැනීම. (මෝස් ක්‍රමය)

විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් එතුලින් සංඥා යැවීමේ උපකරණයක් ඇමරිකන් ජාතික සැමුවෙල් පී මෝස් විසින් 1859 වර්ෂයේ සොයාගැනීමෙන් පසු එය විදුලි සංදේශ පණිවුඩ යැවීම සඳහා භාවිතා කරන ලදී. ඉතාමත් සාර්ථක ක්‍රමයක් වූ මෙය ලොව පුරා භාවිතයට ගන්නා ලදී. මෙම ක්‍රමය මෝස් ක්‍රමය ලෙස හඳුන්වන ලදී.

1959 වර්ෂයේ එනම් වසර සියයකට පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව විසින් මෙරටට ගෙන්වා විදුලි පණිවුඩ සේවාව සඳහා යොදා ගන්නා ලදී. එය ශ්‍රී ලංකා යුධ හමුදාවේද පණිවුඩ හුවමාරු කිරීම සඳහා යොදාගන්නා ලදී. මෙහි ඇති විශේෂත්වය වනුයේ ශබ්දයක් උපයෝගී කර ගනිමින් පනිවුඩ යැවීමයි. මෙය ජාත්‍යන්තර ක්‍රමයක් ලෙස ලොවපුරා ප්‍රචලිත විය.

පෙම්බර සංඥා මෑණී

හමුදා මැණියන්ගේ සුරතල් පොඩි — දෝණි
දියණියො සයක් හැදූ වැඩූ පෙම්බර — මැණි
දුන් යහගුණය සැමටම ඇය — පණාවේණි
ජාතික් වාසනාවන් සංඥා — මැණි

ස්ථිර-ක්ෂණික දායාදය සැමට — බෙදා
දූවරු සයක් තිලිණය කර රටට — පුදා
පෙම්බර මවක සතු යුතුකම ඉවක — නොදා
සාරකාරයෙන් බැඳ දුනි දියණියන් — එදා

මව මෙන් ගුණෙන් රූපෙන් මුල්තැන — ඉන්නා
සෙව්වා දුව ට සහකරුවෙක් මව — දන්නා
දායාදයන් සපුරා මව් පෙම — පෙන්නා
මින්නේරියට ලොකු දුව දීගෙක — දුන්නා

සුරතල් දෝණි 'දෙක සංඥා' — හැඩකාරයි
'ක්ෂණිකව තිරව' වැඩ කරනට — හරිසුරයි
අන් දියණියන් හට තරමක් — අසමානයි
මේ දුව සවම ඉන්නේ අම්මා — ගාවයි

තුන්වෙනි දෝණි හට සහකාරයෙකු — සොයා
වෙහෙසෙන්නට නොවිනි අම්මට දැස — අයා
හිමි සාරයම විත් මේ රැබරිය — සොයා
අනුරාපුරට තුන්වෙන දුව අරන් — ගියා

සිව්වැනි දෝණි නම් තරමක් දඟ — මල්ල
අම්මට බය නමුත් එතරම් නැහැ — මෙල්ල
නුවරින් මඩකලපු ගොස් ආ මේ — කොල්ල
බැන්දට පසුව අඩු වී ඇත — දැඟලිල්ල

අම්මගෙ සුරත ගෙන හිටියත් ලහට — වෙලා
නැහැ සුදු දූවේ නුඹ මා හට බරක් — වෙලා
අම්මගෙ මුහුණ පිප සමුගෙන සඳුළු — සලා
පස්වෙනි දුවත් ගියෙ වාලච්චේන — බලා

මැණිය සිරිය මුත් පොඩි දුව ලෙහි — ගන්නා
මල්සර දෙවිඳු ඇටත් හියෙන් — ඇන්නා
පතිකුලයට පිවිස පොඩිදූව සය — වැන්නා
මන්නාරම වෙනට ඇය පියවර — මැන්නා

මා ප්‍රිය දියණියනි ඔබෙ දිවි තිබෙන — තුරු
දෙමි ඔවදනක් දෑ බැතියෙන් ලයෙහි — පිරූ
නැගෙනහිරින් පායා එන තුරුම — හිරු
පෙලපත රකිනු මැන 'සංඥා' කියන — ගරු

සංඥා මැණියගෙ ඔවදන් අත — නැර
ස්ථිර ක්ෂණික බව පෙන්වා — හැමවාර
සේවය පුදන අද ලක් අම්මට — විර
සංඥා දියණියන්ටයි මේ — උපහාර

සෙ/66282 කෝප්‍රල් ප්‍රේමතිලක ජීඩීඑස්එස්

සංඥා මෑණී සැමදා දිනේවා !

බුදු සරණ බුදු සරණ — වේවා......
දම් සරණ දම් සරණ — වේවා.......
සඟ සරණ සඟ සරණ — වේවා.......
තුන් සරණ නිති සරණ — වේවා.......

ජේසු ස්වාමිගේ පිහිට වේවා ....
අල්ලා දෙවිඳුගේ පිහිට වේවා ......
කඳසුරිඳුගේ පිහිට වේවා ....
සංඥා මැණී ඔබ සැමදා දිනේ...වා .....

බුදු සරණ බුදු සරණ වේවා ......//
ගොඩබිමේ .... ඔබේ සවිය දියුවුනා........
මහ සයුරේ ඔබේ බලය පැතිරුනා ....
ගුවනේ....දී ඔබේ මහිම පැඩි වුනා ....
මුළු බිමේ ඔබට ජය පැතිරුණා.........

බුදු සරණ බුදු සරණ වේවා ....//
පනස් පස් වසරකුත් ගෙවුනා ....
ඔබෙ දරුවො ලක්බිමේ පැතිරුණා........
හමුදාවේ යුද බලය වැඩිවුනා ....
සංඥාවේ නම දසත පැතිරුණා.........

ලාන්ස් I ඩීඑම්කේබී දිසානායක
වැඩ මූලික, සංඥා මූලික වැඩපල

වඩිනු මැනවි . . . . !

ශ්‍රී ලංකා රාජේස්වරිය හා අපට
ඇතිවූ අනේක විඳි දුක් කම්කටොලු
අවස්ථාවන්හිදී ....
ඔබ අප අතරට වැඩියා නොවේද ....?
දයාබර සංඥා මෑණියනි. . . . .
එහිදී . . . . . .
ඔබගේ සිරුරින් වැහිරූ රුහිරු . . . .
ඔබ හෙලූ දුක් සුසුම් . . . . .
මේ වා තලයේ කොතෙකුත් ඇතිද . . .?
සංඥා මෑණියෙනි ,
ත්‍රස්තයේ රුදුරු රකුසා විසින්
ගිලගත් ඔබේම දරුවන් අප කෙසේ නම්
අමතක කරන්නද ....?
ත්‍රස්තවාදයේ ඔදය බිඳලන්නට
දයාබර දේව මෑණියෙනි ,
මේ තීරණාත්මක මොහොතේදී . . . . .
ඔබ තුම්ය අප අතරට
වඩිනු මැනවි . . . . . . !

ජයන්ත ගිණිගද්දරගේ
සංඥා මූලික වැඩපල

"ජයෙන් ජයවේ සැමට සංඥා"

'අවසර බලකාපති, බලසෙන්පති — සංඥා
දෙවනුව අවසරයි අණදෙන නිලධරු — සංඥා
තෙවනුව අවසරයි සෙසුනිලයිනි — සංඥා
ලියනෙම් බිඳක් අප වග තුග ගැන — සංඥා

මින්නේරියේ මහසෙන්පුර පලවන — සංඥා
බලසෙණයකි පනාගොඩ ඇත දෙක — සංඥා
අනුපුර රණ සේවාපුර තුන — සංඥා
යාපා පටුනෙ ඉදිවෙයි සිව්වන — සංඥා

කල්කුඩාවලය ආධාරක පහ — සංඥා
පිහිටා තිබේ මන්නාරම හය — සංඥා
පනාගොඩය ඇත්තේ වැඩපල — සංඥා
බූ වැලිකඩය පිහිටියෙ පාසැල — සංඥා

ස්ථිර, ක්ෂණික නාමය සුපතල — සංඥා
කොළ, නිල් දෙකකි ධජ වර්ණය අප — සංඥා
ගොඩබිම, මුහුද, ගුවනද පරයන — සංඥා
නෙත් යොමු කරනු ලඟදීම එයි හත — සංඥා

නිල ධරුවන් සමඟ සෙසුනිලයින් — සංඥා
යුධ වැද සිටී දස දෙස ලක තුල — සංඥා
දේශය නාමයෙන් දිවිදුන් සැම — සංඥා
'නිවන' පතමි පුත නුඹ සැමටම — සංඥා

උපතින් පනස් පස් වස එළඹෙයි — සංඥා
මෙහෙයුම් සියළු ජයගෙන වැජඹෙයි — සංඥා
ජය මිස පරාජය නොලැබූ අප — සංඥා
'ජයශ්‍රී' ඔබට දළදා සරණයි — සංඥා

සැරයන් ජයවීර විතානගේ
2 රෙජ්:ශ්‍රී ලංකා සංඥා බලකාය(ස්වේ)
පනාගොඩ

දිරිය මව් තුමිය සංඥා බලසේනා

නුඹ ගැබ සාගරය මිහිතලයද — නොනිමි
කරවා 'තිරව ක්ෂණිකව' පණිවුඩ — මැවුනි
එඩිතර පුතුන් සයකට නුඹ මව් ද — වුනි
සංඥා බලකා රෙජිමේන්තුව — ජයනී

අඩ සිය වසක වැඩි නිති සේවය — නොකැලැල්
සුරැකිය හෙලය තම පණතල මෙන් — සැමකල්
හමමින් සබඳ මදනල දස දෙස — සිහිලැල්
දිණුමට සරිකලා යුද පිටියද — නිතිකල්

උතුරද නැගෙනහිර බටහිර දකුණු — දෙස
රැපු සෙන් සතා ජය ගැණුමට සිහල — දෙස
සවි,බල එඩිය පෑ සංඥා කුමරු — සය
සයකිනි බැඳි දිවි හිමියෙන් රකිති — දෙස

අවියෙන් සබඳතා උපකරණින් ද — බැඳී
අතැගිලි පටලවා ජනකා සමඟ — ලැදී
සහයෝගයෙන් එක්වී සටනකට — සැදී
සතුරන් නසා රට එක්සත් කරන — ලදී

කුසුමකි තඹර ඔබ සුලලිත සිහිල් — ජලේ
දිවකර සංඥා කිරණින් විකසිතව — දිලේ
මුසපත්වී දැක බඹරුන් වන — කමලේ
වැජඹෙයි සදා ඔබ හෙල දිව පියුම් — විලේ

කපිතාන් එච්එස් දිසානායක
4 රෙජ්: ශ්‍රී ලංකා සංඥා බලකාය

විදුලි ධාරාවක් ගමන් කරවිය නොහැකි ද්‍රව්‍ය කුසන්නායක (Insulator) ලෙස හැඳින්වේ. පහත දැක්වෙන වගුවෙහි ද්‍රව්‍ය කිහිපයක කුසන්නායකතාවය පිළිබඳ තොරතුරු දැක්වේ.

ද්‍රව්‍යය	කුසන්නායකතාවය
පිඟන් මැටි	ඉතා හොඳයි
වීදුරු	ඉතා හොඳයි
රබර්	ඉතා හොඳයි
දැව	සාමාන්‍යයයි
ජලය	ඉතාමත් අඩුයි

මෙලෙස එක් එක් ද්‍රව්‍යයන් හරහා ඉලෙක්ට්‍රෝන ධාරාවක් ගමන් කිරීමට ඇති හැකියාව හෝ නොහැකියාව පිළිබඳ මැනීමක් කල හැක. එය යම් ද්‍රව්‍යයක ප්‍රතිරෝධය (Resistance) ලෙස මනිනු ලබයි. ඉතාමත් හොඳ සන්නායකයන්ගේ ප්‍රතිරෝධය ශූන්‍යයට ආසන්න වේ. ඉතාමත් හොඳ කුසන්නායකයක ප්‍රතිරෝධය අනන්තයට ආසන්න වේ. සන්නායකයක හෝ කුසන්නායකයක ප්‍රතිරෝධය මැනීම සඳහාද ඒකකයක් භාවිතා කරනු ලබයි. එය ඕම්ස් (OHM) යනුවෙන් හැඳින්වේ.

විද්‍යුත් ගාමක බලයක් හේතු කොට ගෙන සන්නායකයක් තුලින් ගලා යන ඉලෙක්ට්‍රෝන ධාරාව හෙවත් විද්‍යුත් ධාරාවත් එම සන්නායකයේ ප්‍රතිරෝධයත් යන මේ මූල තුන අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ ඕම් නම් විද්‍යාඥයෙක් ඉතා වැදගත් නියමයක් ප්‍රකාශකර ඇත. විදුලිය සබැඳිව ඉදිරිපත් කර ඇති මෙම නියමය ඕම්ගේ නියමය (OHM's LAW) ලෙස හඳුන්වනු ලබයි.. මෙය ඉතා වැදගත් නියමයක් වන අතර ඉන් ප්‍රකාශ වන්නේ උෂ්ණත්වය නොවෙනස්ව පවතින අවස්ථාවක සන්නායකයක් තුලින් ගලායන විද්‍යුත් ධාරාව එහි දෙකලවර විද්‍යුත් ගාමක බලයන්හි වෙනස හෙවත් විභව අන්තරයට (Potential Difference) අනුලෝමව සමානුපාතික වන බවයි. මේ අනුව පහත දැක්වෙන සමීකරණය ඉදිරිපත් කර ඇත.

* වි. ගා. බ. අතර වෙනස
(විභව අන්තරය) = ගලායන ධාරාව x
සන්නායකයේ ද ප්‍රතිරෝධය
මෙය $V = I \times R$ යනුවෙන්ද බොහෝ විට දැක්වේ.

මෙහි V යනු වි. ගා. බලයන්ගේ වෙනස වන අතර I යනු ගලා යන ධාරාවත් R යනු සන්නායකයේ ප්‍රතිරෝධයත් වේ.

ඉහතින් දක්වන ලද කරුණු ප්‍රත්‍යාවර්ථ හා සරල ධාරාව යන ධාරා වර්ග දෙකටම පොදු වූවකි. සරල ධාරාවත් ප්‍රත්‍යාවර්ථ ධාරාවත් අතර වෙනස වන්නේ ධාරාව ගමන් ගන්නා දිශාවයි. සරල ධාරාව සෑම විටම නියමිත දිශාවක් ඔස්සේ ගමන් ගනී. නමුත් ප්‍රත්‍යාවර්ථ ධාරාව එසේ නොවේ. ප්‍රත්‍යාවර්ථ ධාරාව නිශ්චිත කාලාන්තරයක් තුල එය ගමන් ගන්නා දිශාව මාරු වෙමින් ගමන් ගනී. එනම් ප්‍රත්‍යාවර්ථ ධාරාව යම්කිසි සංඛ්‍යාතයක් ඇතිව ගමන් ගනී. සරල ධාරාව සඳහා එසේ සංඛ්‍යාතයක් නොමැත.

සරල ධාරාව



කාලයත් සමඟ ධාරාව ගමන් ගන්නා දිශාව වෙනස් නොවේ. සංඛ්‍යාතයක් නොමැත

ප්‍රත්‍යාවර්ථ ධාරාව



කාලයත් සමඟ ධාරාව ගමන් ගන්නා දිශාව වෙනස් වේ. සංඛ්‍යාතයක් ඇත.

සාමාන්‍ය විදුලි පන්දම් බැටරියකින් හෝ ලෙඩ් ඇසිඩ් බැටරියකින් අපට සෑම විටම ලැබෙන්නේ සරල ධාරාවකි. සාමාන්‍ය බයිසිකල් ඩයිනමෝවකින් විදුලි ජනක යන්ත්‍රයකින් අපට ලැබෙන්නේ ප්‍රත්‍යාවර්ථ ධාරාවකි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් විද්‍යුත් චුම්භක ක්‍රියවලියකදී හැර අන් සෑම අවස්ථාවකදීම (රසායනික හෝ වෙනයම් ක්‍රියාවකදී) අපට ලැබෙන්නේ සරල ධාරා විදුලියයි. අප රටෙහි භාවිතාවන ප්‍රධාන විදුලිය ප්‍රත්‍යාවර්ථ ධාරාවයි. එහි සංඛ්‍යාතය තත්පරයකට චක්‍ර 50 කි. වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් ධාරාව ගමන් ගන්නා දිශාව තත්පර එකක කාලයක් තුලදී 50 වාරයක් වෙනස් වෙමින් පවතී. සංඛ්‍යාතය මැනීම සඳහා හර්ට්ස් (Hertz) නම් ඒකකය භාවිතය කරයි. එය බොහෝ තැන්වලදී Hz යනුවෙන් දක්වනු ලබයි. බොහෝ විට ප්‍රත්‍යාවර්ථ ධාරාව සඳහන් වන තැන්වල එහි විද්‍යුත් ගාමක බලය හා සංඛ්‍යාතය සඳහන් කරනු ලබයි. අප රටෙහි භාවිතා කරනු ලබන ප්‍රධාන විදුලියෙහි විද්‍යුත් ගාමක බලයෙහි අගය සාමාන්‍යයෙන් වෝල්ට් 230 කි. මේ නිසා ප්‍රධාන විදුලියෙන් භාවිතා කරනු ලබන බොහොමයක් උපකරණ වල එය 230 V/ 50 Hz යනුවෙන් සඳහන් වී ඇති ආකාරය ඔබ බොහෝ විට විදුලි උපකරණ වල දකින්නට ඇත. සමහර රටවල මෙම අගයන් වෙනස් වේ. ඒ අනුව විද්‍යුත් ගාමක බලය වෝල්ට් 110 හෝ වෝල්ට් 115 වේ. එමෙන්ම සංඛ්‍යාතයද හර්ට්ස් 60 ක් වේ. මෙවැනි අවස්ථාවන්හිදී යොදාගනු ලබන විද්‍යුත් උපකරණ වල 110V/ 60 Hz හෝ 115 V / 60 Hz යනුවෙන් සඳහන් කොට ඇත. එවැනි උපකරණ වෙනොත් අප රටේ පවතින විදුලි පද්ධතිය සමග සෘජුවම භාවිතා කල නොහැකි අතර පරිවර්ථක (Converter) වැනි උපකරණයක් භාවිතා කිරීමෙන් අප රටේ භාවිතා වන විදුලිබල පද්ධතිය හා සම්බන්ධ කර ගත හැක.

ලුතිනන් (උපා) ඩබ්ඊසී විජේරත්න
සංඥා මූලික වැඩපල, පනාගොඩ

විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් සංඥා යැවීමේ උපකරණ සොයා ගැනීම. (මෝස් ක්‍රමය)

විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් එතුලින් සංඥා යැවීමේ උපකරණයක් ඇමරිකන් ජාතික සැමුවෙල් පී මෝස් විසින් 1859 වර්ෂයේ සොයාගැනීමෙන් පසු එය විදුලි සංදේශ පණිවුඩ යැවීම සඳහා භාවිතා කරන ලදී. ඉතාමත් සාර්ථක ක්‍රමයක් වූ මෙය ලොව පුරා භාවිතයට ගන්නා ලදී. මෙම ක්‍රමය මෝස් ක්‍රමය ලෙස හඳුන්වන ලදී.

1959 වර්ෂයේ එනම් වසර සියයකට පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව විසින් මෙරටට ගෙන්වා විදුලි පණිවුඩ සේවාව සඳහා යොදා ගන්නා ලදී. එය ශ්‍රී ලංකා යුධ හමුදාවේද පණිවුඩ හුවමාරු කිරීම සඳහා යොදාගන්නා ලදී. මෙහි ඇති විශේෂත්වය වනුයේ ශබ්දයක් උපයෝගී කර ගනිමින් පනිවුඩ යැවීමයි. මෙය ජාත්‍යන්තර ක්‍රමයක් ලෙස ලොවපුරා ප්‍රචලිත විය.

පෙම්බර සංඥා මෑණී

හමුදා මෑණියන්ගේ සුරතල් පොඩි — දෝණි
දියණියො සයක් හැදූ වැඩූ පෙම්බර — මෑණි
දූන් යහගුණය සැමටම ඇය — පණවේණි
ජාතිත් වාසනාවන් සංඥා — මෑණි

ස්ථිර-ක්ෂණික දායාදය සැමට — බෙදා
දූවරු සයක් තිලිණය කර රටට — පුදා
පෙම්බර මවක සතු යුතුකම ඉටත — නොදා
කරකාරයෙන් බැඳ දූනි දියණියන් — එදා

මව මෙන් ගුණෙන් රූපෙන් මුල්තැන — ඉන්නා
සෙව්වා දුවට සහකරුවෙක් මව — දන්නා
දායාදයන් සපුරා මව් පෙම — පෙන්නා
මින්නේරියට ලොකු දුව දීගෙක — දූන්නා

සුරතල් දෝණි 'දෙක සංඥා' — හැඩකාරයි
'ක්ෂණිකව තිරව' වැඩ කරනට — හරිසුරයි
අන් දියණියන් හට තරමක් — අසමානයි
මේ දුව තවම ඉන්නේ අම්මා — ගාවයි

තුන්වෙනි දෝණි හට සහකාරයෙකු — සොයා
වෙහෙසෙන්නට නොවිනි අම්මට දැස — අයා
හිමි කාරයම විත් මේ රැබරිය — සොයා
අනුරාපුරට තුන්වෙන දුව අරන් — ගියා

සිව්වැනි දෝණි නම් තරමක් දඟ — මල්ල
අම්මට බය නමුත් එතරම් නැහැ — මෙල්ල
නුවරින් මඩකලපු ගොස් ආ මේ — කොල්ල
බැන්දට පසුව අඩු වී ඇත — දැහමිල්ල

අම්මගෙ සුරත ගෙන හිටියත් ලහට — වෙලා
නැහැ සුදු දුවේ නුඹ මා හට බරක් — වෙලා
අම්මගෙ මුහුණ පිප සමුගෙන කඳුළු — සලා
පස්වෙනි දුවත් ගියෙ වාලච්චේන — බලා

මෑණිය සිරිය මුත් පොඩි දුව ලෙහි — ගන්නා
මල්සර දෙව්දු ඇටත් හියෙන් — ඇන්නා
පතිකුලයට පිවිස පොඩිදුව සය — වැන්නා
මන්නාරම වෙතට ඇය පියවර — මැන්නා

මා ප්‍රිය දියණියනි ඔබෙ දිවි තිබෙන — තුරු
දෙමි ඔවදනක් දැ බැතියෙන් ලයෙහි — පිරූ
නැගෙනහිරින් පායා එන තුරුම — හිරු
පෙලපත රකිනු මැන 'සංඥා' කියන — ගරු

සංඥා මෑණියගෙ ඔවදන් අත — නැර
ස්ථිර ක්ෂණික බව පෙන්වා — හැමවාර
සේවය පුදන අද ලක් අම්මට — වීර
සංඥා දියණියන්වයි මේ — උපහාර

සෙ/66282 කෝප්‍රල් ප්‍රේමතිලක ජඩීඑස්එස්

"ජයෙන් ජයවේ සැමට සංඥා"

'අවසර බලකාපති, බළසෙන්පති — සංඥා
දෙවනුව අවසරයි අණදෙන නිලධරු — සංඥා
තෙවනුව අවසරයි සෙසුනිලයිනි — සංඥා
ලියනෙමි බිඳක් අප වග තුග ගැන — සංඥා

මින්නේරියේ මහසෙන්පුර පළවන — සංඥා
බලසෙණයකි පනාගොඩ ඇත දෙක — සංඥා
අනුපුර රණ සේවාපුර තුන — සංඥා
යාපා පටුනෙ ඉදිවෙයි සිව්වන — සංඥා

කල්කුඩාවලය ආධාරක පහ — සංඥා
පිහිටා තිබේ මන්නාරම හය — සංඥා
පනාගොඩය ඇත්තේ වැඩපල — සංඥා
බූ වැලිකඩය පිහිටියෙ පාසැල — සංඥා

ස්ථිර, ක්ෂණික නාමය සුපතල — සංඥා
කොළ, නිල් දෙකකි ධජ වර්ණය අප — සංඥා
ගොඩබිම, මුහුද, ගුවනද පරයන — සංඥා
නෙත් යොමු කරනු ලහදිම එයි හන — සංඥා

නිල ධරුවන් සමඟ සෙසුනිලයින් — සංඥා
යුධ වැද සිටී දස දෙස ලක තුල — සංඥා
දේශය නාමයෙන් දිවිදුන් සැම — සංඥා
'නිවන' පතමි පුන නුඹ සැමටම — සංඥා

උපතින් පනස් පස් වස එළඹෙයි — සංඥා
මෙහෙයුම් සියළු ජයගෙන වැජඹෙයි — සංඥා
ජය මිස පරාජය නොලැබූ අප — සංඥා
'ජයශ්‍රී' ඔබට දළදා සරණයි — සංඥා

සැරයන් ජයවීර විතානගේ
2 රෙජි:ශ්‍රී ලංකා සංඥා බලකාය(ස්වේ)
පනාගොඩ

සංඥා මෑණි සැමදා දිනේවා !

බුදු සරණ බුදු සරණ — වේවා......
දම් සරණ දම් සරණ — වේවා.......
සඟ සරණ සඟ සරණ — වේවා.......
තුන් සරණ නිති සරණ — වේවා.......

ජේසු ස්වාමිගේ පිහිට වේවා ....
අල්ලා දෙවිඳුගේ පිහිට වේවා ......
කඳසුරිඳුගේ පිහිට වේවා ....
සංඥා මෑණී ඔබ සැමදා දිනන්...වා .....

බුදු සරණ බුදු සරණ වේවා ......//
ගොඩබිමෙ .... ඔබේ සවිය දියුවුනා........
මහ සයුරේ ඔබේ බලය පැතිරුනා ....
ගුවන්...දී ඔබේ මහිම වැඩි වුනා ....
ලංකා බිමේ ඔබට ජය පැතිරුණා.........

බුදු සරණ බුදු සරණ වේවා ....//
පනස් පස් වසරකුත් ගෙවුනා ....
ඔබෙ දරුවො ලක්බිමෙ පැතිරුණා........
හමුදාවෙ යුද බලය වැඩිවුනා ....
සංඥාවේ නම දසත පැතිරුණා.........

නනි I ඩීඑම්කේබී දිසානායක
වැඩ මූලිකා, සංඥා මූලිකා වැඩපල

වඩිනු මැනවි . . . . !

ශ්‍රී ලංකා රාජේස්වරිය හා අපට
ඇතිවූ අනේක විදි දුක් කම්කටොලු
අවස්ථාවන්හිදී ....
ඔබ අප අතරට වැඩියා නොවේද ....?
දයාබර සංඥා මෑණියනි. . . . .
එහිදී . . . . . .
ඔබගේ සිරුරින් වැහිරූ රුහිරු . . . .
ඔබ හෙලූ දුක් සුසුම් . . . . .
මේ වා තලයේ කොතෙකුත් ඇතිද . . .?
සංඥා මෑණියෙනි ,
ත්‍රස්තයේ රුදුරු රකුසා විසින්
ගිලගත් ඔබේම දරුවන් අප කෙසේ නම්
අමතක කරන්නද ....?
ත්‍රස්තවාදයේ ඔදය බිඳලන්නට
දයාබර දේව මෑණියෙනි .
මේ තීරණාත්මක මොහොතේදී . . . . .
ඔබ තුමිය අප අතරට
වඩිනු මැනවි . . . . . . !

ජයන්ත ගිණිගද්දරගේ
සංඥා මූලික වැඩපල

දිරිය මව් තුමිය සංඥා බලසේනා

නුඹ ගැඹ සාගරය මිහිතලයද — නොතිමී
කරවා 'තිරව ක්ෂණිකව' පණිවුඩ — මැවුනී
එඩිතර පුතුන් සයකට නුඹ මව් ද — වූනී
සංඥා බලකා රෙජිමේන්තුව — ජයනී

අඩ සිය වසක වැඩි නිති සේවය — නොකැලැල්
සුරුකිය හෙලය තම පණතල මෙන් — සැමකල්
ගමමින් සබඳ මදතල දස දෙස — සිහිලැල්
දිණුමට සරිකලා යුද පිටියද — නිතිකල්

උතුරද නැගෙනහිර බටහිර දකුණු — දෙස
රැපු සෙන් සතා ජය ගැණුමට සිහල — දෙස
සවි,බල එඩිය පෑ සංඥා කුමරු — සය
සයකිනි බැඳි දිවි හිමියෙන් රකිති — දෙස

අවියෙන් සබඳතා උපකරණින් ද — බැඳී
අතැඟිලි පටලවා ජකක සමඟ — ලැදී
සහයෝගයෙන් එක්වී සටනකට — සැදී
සතුරන් නසා රට එක්සත් කරන — ලදී

කුසුමකි තඹර ඔබ සුලලිත සිහිල් — ජලේ
දිවකර සංඥා කිරණින් විකසිතව — දිලේ
භූසපත්වී දැක බඹරුන් වන — සමලේ
වැජඹෙයි සදා ඔබ හෙල දිව පියුම් — විලේ

කපිතන් එච්එස් දිසානායක
4 රෙජි: ශ්‍රී ලංකා සංඥා බලකාය

සංඥා පාසැල් මාතාවෝ

නිලධාරීන් හා සෙසු නිලයින් සීමිත සංඛ්‍යාවකින් සමන්විත උපාලබ්ධු සංඥා බලකාය යුගයේඅවශ්‍යතාවයසමග වර්ධනයවන්නට විය. උපතින්ම වෘත්තීයමය ඒකකයක්වූ මෙහි කාර්ය බහුලත්වය නිසා නිලධාරීන්ට හා සෙසු නිලයින්ට තම කාර්යයන් පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගත යුතු තත්වයකට පත්විය. එසේම මූලික හමුදාමය පුහුණු වීම තම ඒකකයන් විසින්ම කර ගැනීමටද සිදුවූයෙන් අභ්‍යාස බලසෙණයක් පිළිබඳ සංකල්පය ඇතිවිය. එම සංකල්පය ඵලදැරීමක් වශයෙන් 1 වන රෙජි ශ්‍රීලංසංඛ බලකායට අනුබද්ධව අභ්‍යාස බලසෙණය නමින් බලසෙණයක් පිහිටුවිය. පනාගොඩ සංඥා බලකායෙහිම ගොඩනැගිලි දෙකකට උරුමකම් කී මෙහි ප්‍රධාන උපදේශක ලෙස නිලධාරියෙක්ද, පාලන අංශය භාර ජේ.කො.නො.නි. යෙක්ද, පුහුණු අංශ භාර කො.නො.නි.යෙකුගෙන්ද, සරඹ උපදේශක වරයෙකුගෙන්ද, ලිපි කරුවන් සිවුදෙනකුගෙන්ද සමන්විත විය. එහිදී ප්‍රධාන වශයෙන් ආධුනික, මූලික සංඥා, නිල උසස් කිරීමේ පාඨමාලාවන්ද සිදු කරන ලද අතර වෙනත් ඒකක පාඨමාලා ඉදහිට සිදුවිය.

මෑත භාගයේ යුධ හමුදාවෙහි ක්‍රියාන්විත අවශ්‍යතාව සඳහා සංඥා බලකා රෙජිමේන්තු සංඛ්‍යාව ව්‍යාප්ත වූ අතර මේවා සංඥා සහ පාබල රාජකාරී සඳහා විවිධ ප්‍රදේශ වල ස්ථාන ගත විය. මේ හේතුවෙන් අභ්‍යාස බලසෙණයද පනාගොඩ සිට බූවැලිකඩ - මහනුවර දක්වා සංක්‍රමනය විය. එය පවත්වා ගෙන යෑමේදී ඇති වූ විවිධ අඩුපාඩුකම් නිසා ස්වාධීනව නැගී සිටීමේ අවශ්‍යතාවය රෝපනය වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභ්‍යාස බලසෙණය සංඥා පාසැල නමින් ස්වාධීනත්වයට පත් විය. 93.12.27 මුල්ම සේනාවිධායක වශයෙන් මේජර් ඒඒ පෙරේරා පත්විය. එදා මෙදා තුර සේනාවිධායක වරුන් නමදෙනෙකුගේ අණදීම යටතේ සංඥා පාසැල් මාතාව වර්ධනය වී ඇති අතර දැනට කාර්ය මණ්ඩලය වශයෙන් නිළධාරීන් තිදෙනෙක් සෙසු නිලයින් 71 දෙනකුගෙන්ද සමන්විතව පවතී.

එදා ආධුනික හා මූලික සංඥා පාඨමාලාවන්ට සීමා වූ රාජකාරීන් අද ඉතා පුළුල් තත්වයකට පත් කරමින් විවිධ වර්ගයේ පාඨමාලා 12 ක් පමන පවත්වනු ලබයි. පෙරදී තම ඒකකයන් විසින්ම සිදුකරණු ලැබූ සියලුම වෘත්තීය පාඨමාලාවන් (1 වන ශ්‍රේණිය හා 11 වන ශ්‍රේණිය) පැවැත්වීමේ වගකීම සංඥා පාසැල විසින් භාරගෙන ඇත. එසේම සංඥා සෙබලුන් මත පැවරී ඇති අධික රාජකාරීන් අඩුකර ගැනීමටත් පාබල රාජකාරීන්හිදී ආබාධිත තත්වයට පත්වන රණවිරුවන්ට සහයක් වශයෙන් සංඥා රාජකාරීන් පිළිබඳව පුහුණුවක් ලබාදීමට වෙනත් ඒකක සඳහා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා කරවීමේ හා විදුලි කෝෂ ආරෝපනය කිරීමේ පාඨමාලාවන් පවත්වනු ලබයි. සාමාන්‍ය සෙබල සිට කෝප්‍රල් නිලය දක්වා නිලයන් මේ සඳහා සුදුස්සෝ වෙති. මූලික පාඨමාලාවන්ගෙන් විශේෂ දක්ෂතාවයන් දක්වන්නන්ට තම කටයුතු ඉදිරියට කරගෙන යෑමට අත දීමක් වශයෙන් සංඥා උපදේශක පාඨමාලාවක්ද පවත්වනු ලබයි. මෙයට සාමාන්‍ය සෙබල සිට බලලන් නිලධාරීන් දක්වා නිලයන්ට සහභාගී විය හැක. සංඥා රාජකාරී පිළිබඳව වෙනත් ඒකක වල සිටින නිළධාරීන්ට පුළුල් අවබෝධයක් ලබා දීම පිනිසත් නිලධාරීන්ට තම ඒකක වලම සංඥා රාජකාරී කරවීම සඳහාත් සංඥා නිලධාරී පාඨමාලාවක්ද පැවැත්වේ. මීට අමතරව ආධුනික, මූලික සංඥා නිල උසස් කිරීම් හා සංස්කරණ පාඨමාලා පැවැත්වීමේ වගකීම ද ඉටුකරනු ලබයි. ත්‍රිවිධ හමුදාවන් සඳහා පැවැත්වෙන විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාව යුගයේ අවශ්‍යතාවය මත ගොඩනැගුණු ඉතාමත් අත්‍යාවශ්‍ය පාඨමාලාවකි. මෙමගින් විද්‍යුත් සංග්‍රාමයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙනු ලැබේ.

සංඥා පාසැල මේ වන විට වසරක් තුල පහත සඳහන් පාඨමාලාවන් පැවැත්වීමට සමත්කම් දරමින් සිටී.

අනු අංකය	පාඨමාලාව	සිසුන් ගණන	නිළය	පාඨමාලා දින ගණන	වසරකට නියමිත පාඨමාලා සංඛ්‍යාව
01	නිල උසස් කිරීමේ පාඨමාලාව	40	කෝප්‍රල් සිට සැරයන් දක්වා	දින 45	03
02	මූලික සංඥා පාඨමාලාව	50	ආධුනික සෙබල	දින 70	03
03	ගුවන් විදුලි ක්‍රි: (වෘතීය 1 ශ්‍රේණිය)	20	කෝප්‍රල් සිට සැරයන් දක්වා	දින 21	03
04	ගුවන් විදුලි ක්‍රි: (වෘතීය 11 ශ්‍රේණිය)	20	සංසෙ සිට ලා/කෝ දක්වා	දින 21	03
05	සංඥා මධ්‍යස්ථාන ක්‍රි: (වෘතීය 1 ශ්‍රේණිය)	-20	කෝප්‍රල් සිට සැරයන් දක්වා	දින 21	03
06	සංඥා මධ්‍යස්ථාන ක්‍රි: (වෘතීය 11 ශ්‍රේණිය)	20	සංසෙ සිට ලා/කෝ දක්වා	දින 21	03
07	දු:මා:න: (වෘතිය 1 ශ්‍රේණිය)	20	කෝප්‍රල් සිට සැරයන් දක්වා	දින 21	03
08	දු:මා:න: (වෘතිය 11 ශ්‍රේණිය)	20	සංසෙ සිට ලා/කෝ දක්වා	දින 21	03
09	රෙජිමේන්තු සංඥා නිළධාරී නිත්‍ය/ස්වේච්ඡා	20	2/ලුතිනන් සිට කපිතාන් දක්වා	දින 21	02
10	ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරු පාඨමාලාව	40	සංසෙ සිට කෝප්‍රල් දක්වා	දින 35	03
11	සංඥා උපදේශක පාඨමාලාව	40	සංසෙ සිට සැරයන් දක්වා	දින 35	02
12	විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාව (ත්‍රිවිධ හමුදාව)	40	සංසෙ සිට සැරයන් දක්වා	දින 35	01

ජීවිත අගහිඟකම් මධ්‍යයේ ජීවිකාව ගෙනගිය සංඥා පාසැල අද දියුණුවේ හිනි පෙත්ත කරා ගමන් කරමින් පවතී. පුස්තකාලයක්, ගුවන් විදුලි හා විදුලි සංදේශ විද්‍යාගාරයන් 02 ක් හා අතීතයේ සංඥා බලකාය මගින් භාවිතා කරන ලද සංඥා උපකරණ වලින් සමන්විත කෞතුකාගාරයක්, දේශණ ශාලාවක් හා ක්‍රීඩා ගාරයක් ආදියෙන් පිරිපුන් වීමට සංඥා පාසැල භාග්‍යවන්ත වී ඇත. දිනෙන් දින සංඥා පාසැල් මාතාවෝ සංඥා අඹරේ දිදුලන තාරකාවක් මෙන් බබලමින් පවතී.

සැකසුම:
සංඥා පාසැල,
බූවැලිකඩ, මහනුවර

පරිගණක සහ පරිගණක විද්‍යාවට හැඳින්වීමක්

නොයෙකුත් විද්‍යාවන් සේම පරිගණක විද්‍යාවද ඊටම අදාල වූ පාරිභාසික ශබ්ද කෝෂයක් ඇති විද්‍යාවකි. එම විද්‍යාව හැදෑරීමේදී එයටම අදාල වූ විවිධ වදන් ඔබට හමු වනු ඇත. සමහරක් ඔබ දන්නා හඳුනන ඒවා වීමට ඉඩ ඇති අතර සමහරක් නොදන්නවා විය හැක. එසේම සිංහලෙන් මෙම විද්‍යාව හැදෑරීමේදී අප සිංහල, ඉංග්‍රීසි සහ පරිගණක විද්‍යාවේ වදන් අතර අතරමං වීම වැලැක්විය නොහැක. නමුත් අප එය කල යුතුමය.

මූලික හැඳින්වීම් සහ යෙදීම්

පරිගණකය අර්ථ දැක්වීම

පරිගණකයක් යනු ගබඩා කරන ලද ක්‍රමලේඛයක් මගින් පාලනය කරමින් ස්වයංක්‍රියව දත්ත ලබාගනිමින් ගබඩාකරමින් සහ විශ්ලේෂණය කරමින් එම විශ්ලේෂණ මගින් පිටතට තොරතුරු ලබා දෙන උපකරණයක් ලෙස අර්ථ දැක්විය හැක.

මූලික පරිගණක වර්ග
Digital, Analog and Hybrid

අංකිත පරිගණක

අංකිත (Digital) පරිගණක මෙනමින් හැඳින්වෙන්නේ, විශ්ලේෂණය කරන ලද දත්ත (0,1,2,3) අදී වශයෙන් පිළිවලින් ඉදිරිපත් කරන හෙයිනි. Digital අත් ඔරලෝසු තුලද කුඩා පරිගණකයක් ඇතැයි මේ අනුව අපට පැවසිය හැක.

ප්‍රතිසම පරිගණක

ප්‍රතිසම(Analog) වර්ගයේ පරිගණක පාවිච්චි කරනු ලබන්නේ උෂ්ණත්වමාන, වෝල්ටේජමාන ආදී උපකරණ වලය. ඒවායින් දෙනු ලබන තොරතුරු සරල ප්‍රස්ථාර ආදියෙන් ඉතා සුමට ලෙස පිට කරනු ලබයි.

මිශ්‍ර පරිගණක

මිශ්‍ර (Hybrid) පරිගණක යනු ඉහත ඉලක්කම් ක්‍රම දෙකම පාවිච්චි කරනු ලබන පරිගණක වේ. අප මෙහිදී කථා කරනු ලබන්නේ ලෝකයේ දැනට වඩා ප්‍රචලිත වර්ගයේ පරිගණක ගැන පමණකි.

අදාලත්වය (Purpose)

විශේෂ කාර්ය පරිගණක හා පොදුකාර්ය පරිගණක

විශේෂ කාර්ය පරිගණක

ඒ නම සඳහන් කල අයුරින්ම මේවා විශේෂ කාර්යයන් සඳහාම නිර්මාණය වූ ඒවාය. උදාහරණ වශයෙන් මිසයිල යොමු කිරීමේ ක්‍රම ඉන්ධන මීටර් ආදිය දැක්විය හැක.

පොදු කාර්ය පරිගණක

නොයෙක් වර්ගයේ කාර්යයන් කිරීම සඳහා නිපදවනු ලබන පරිගණක මෙසේ හැඳින්වේ.

පාවිච්චිය අනුව වර්ග කිරීම

ඉහත සඳහන් මාතෘකාව අනුව දිගු ලැයිස්තුවක් අපට දැක්විය හැක.

* පද සැකසුම (Word Processing)
  කාර්යාල පාවිච්චිය සඳහා ලිපි ගොනු ආදිය සැපයීම මෙනමින් වේ.
* නිවෙස් පරිගණක
  ගෘහයන් හි ඇති සුලු කාර්යයන් සඳහා නිපදවන පරිගණක
  (උදා- ගෘහ මුදල් ගණු දෙනු)
* පුද්ගල පරිගණක (Personal Computer)
  මේවා තනි පාවිච්චිය සඳහා සාදනු ලබන පරිගණකයන් වන අතර තැනින් තැනට ගෙන යා හැකිද වන්නේය. සමහර විට (Main frame and Mini Computer) සමග සම්බන්ධ වී අවශ්‍යය දත්ත ලබා ගැනීමේ හැකියාවද ඇත.
* (Embeded) මෙම පරිගණක කෙලින්ම ඇතුලත් නොවිය හැකි පරිගණක වේ. උදාහරණයකට වෙළඳ පොලවල්හි මිල ගණන් සැකසීමට ඇති පරිගණකයන් දැක්විය හැක.

තවදුරටත් වර්ග කරමු (Further Clasification)

මහා පරිගණක (Main frame) - විශාල විශ්ලේෂක බලයක්ද ගබඩා කිරීමේ බලයක් සහ ඇතුලත් කිරීමේ/පිටකිරීමේ බලයක් ඇති පරිගණක මේ නමින් හැඳින්වේ.

මධ්‍ය පරිගණක (MINI) - ඉහතට වඩා කුඩා විශේෂ කාර්යක් සඳහා යොදා ගන්නා පරිගණකය මේ නම් වේ.

ක්ෂුද්‍ර (Micro) - චිපයන්ගේ කුඩා වීමත් සමගම පැන නැගුනු කුඩා ප්‍රමානයේ පුද්ගලික පරිගණක වේ. උදාහරණයක් ලෙස Desk-top, Lap top , Palm top පරිගණක පෙන්වා දිය හැක.

පරිගණක පරම්පරාවන් (Computer Generations)

පලමු ඉලෙක්ට්‍රොනික් පරිගණකය 1940 දී නිපදවන ලදී. මෙය දැන් පරම්පරා ගනනින් ඉදිරියට යමින් පවතී.

පලමු පරම්පරාව (First Generation)

මුල්ම පරිගණකය වැල්වය යොදන ලද (1940) උදා- EDSAC, EDVAC, LEO AND UNIVAC

දෙවන පරම්පරාව (Second Generation)

වඩා විශ්වාසදායක පරම්පරාව (Transistor) යොදන ලදී. උදා- LEO Mark III, ATCAS and ZBM 7000 series.

තෙවන පරම්පරාව (Third Generation)

වඩා බලවත් ලෙස විශ්වාස කල හැකි මට්ටමේ පරිගණක සරල (IC) පරිපථ යොදන ලදී. උදා- ICL 1900 series and IBM 360 series.

සිව් වැනි පරපුර (Fourth Generation)

අද පාවිච්චි කරනු ලබන පරිගණක මෙනමින් වේ. වඩා බලවත්, කාර්යක්ෂම ඉලෙක්ට්‍රොනික උපකරණ සහ සංකීර්ණ (IC) පාවිච්චි කර ඇත. මේවා විශාල වර්ගයේ කුඩා කිරීම් (Large Scale Intergation - LSI) හා ඉතා විශාල වර්ගයේ කුඩා කිරීම් (Very Large Scale Intergration - VLSI) වශයෙන් වර්ග කොට ඇත.

පස්වන පරපුර (Fifth Generation)

සැවොම බලාපොරොත්තු වන පරිදි සිතන කථා කරන පරිගණක මේ නමින් හැඳින්වීමට ඉඩ ඇත.

පරිගණකයක මූලික ක්‍රියාකාරකම්

පරිගණක පද්ධතියක සැකසුම මෙසේය.

ඇතුලත් කිරීම (Input)

පරිගණකයකට දැනෙනයේ දත්ත ඇතුලත් කිරීම මෙනම් වේ.

ගබඩා කිරීම (Storage)

දත්ත සහ උපදෙස් ප්‍රධාන ගබඩාවට (Main storage) ඇතුළත් කිරීමෙන් පසු එය අවශ්‍ය වෙලාව වනතෙක් එහි රඳවා තබනු ලබයි.

මෙම ප්‍රධාන දත්ත හා උපදෙස් ගබඩාව ඊට වඩා මිල අඩු අමතර ගබඩාවක් සමග පැමිණේ. එය ආදේශක ආවය (Backing storge) නමින් හැඳින්වේ. උදා- Hard Disk (1GB) ය වඩා විශාල දත්ත හා උපදෙස් ගබඩාකිරීමේදී පාවිච්චි කරයි. මෙය දත්ත පවත්වා ගෙනයාමේදී ඉතා විශාල වශයෙන් උපකාර වේ.

පාලනය (Control)

සෑම පරිගණකයක්ම ඊට අදාල වූ පාලක කොටසක් සමග පැමිණේ. මෙය ප්‍රධාන ගබඩාවෙන් උපදෙස් ගෙන ගොස්, එය පරිවර්තනය කර සහ අවැසි සංඥා පරිගණක කොටස් වලට නිකුත් කොට එය පද්ධතියක් බවට පත්කරනු ලබයි. එය සියලු දෘඩාංග පරිගණක අණයන්ගෙන් මෙල්ල කොට තබා ගැනීමට ක්‍රියා කරයි.

විශ්ලේෂනය (Processing)

උපදෙස් වලට මෙල්ල වූ පසු ගනිතමය හා තර්කමය ආදී වූ ක්‍රියාකාරකම් දත්තයන් මත ක්‍රියා කරනු ලබයි. එම ක්‍රියාව කරනු ලබන කොටස Arithmatic and Logical Unit (ALU) වශයෙන් හඳුන්වනු ලබයි. ගනිතමය ක්‍රියාකාරකම් හැරෙන්නට තර්කයන් (Logical) ඒ මත ක්‍රියා කරයි. මෙය ඉතා වේගවත්ය. කෙසේදයත් මිලියන 10ක ඉලක්කම් එක් තත්පරයක් තුලදී එකතු කල හැකි තරම්ය.

නිමැවුම (Output)

ප්‍රතිඵල ප්‍රධාන දත්ත ගබඩාවෙන් ගෙන නිමැවුම් උපකරණයකට (Output device) යවනු ලබයි. මෙය සමහර විට මුද්‍රකයකට (Printer) විය හැක. එම මුද්‍රණය කරන ලද්ද හඳුන්වනුයේ Hard Copy වශයෙන්ද එසේම එය පරිගණකයේ තිරය මත දැක්විය හැක.

පරිගණකයක තර්කමය සැකැස්ම (Logical Structure of the Computer)

සාමාන්‍යයෙන් දත්ත ගලා යන්නේ ඇතුලත් කිරීමේ උපකරණයක (Input device) සිට හෝ අමතර ගබඩාවේ (backage storage) සිට ප්‍රධාන දත්ත (Mainstorage) ගබඩාවේ සිට නිමැවුම් උපකරණයට (output device) හෝ අමතර ගබඩාවටය (backing storage).

විශ්ලේෂණය (Processing) දත්ත මත ක්‍රියාකාරකම් කරනුයේ ප්‍රධාන දත්ත ගබඩාවේ වන අතර එහි ප්‍රතිඵලද ප්‍රධාන දත්ත ගබඩාවටම ලබා දෙනු ලබයි.

සමහර අවස්ථාවන්හිදී දත්ත කෙලින්ම විශ්ලේෂකය, ඇතුලත් කිරීමේ උපකරණය (Out put device) අතර මුලින් දක්වන ලද ආකාරයට වෙනස්ව ක්‍රියා කරනු ලබයි.

මෙහි විශ්ලේෂකය සැදී ඇත්තේ ගනිතමය හා තර්කමය අංශය (ALU) හා පාලකය (Control unit) යන ආයතන දෙකේ එකතුවෙනි.

මෙහි වර්ග දෙකක ගලායාමයන් පෙන්වා ඇත. එක් වර්ගයක් දත්ත හා උපදෙස් ගෙන යන අතර අනෙක් වර්ගයෙන් අණ හා සංඥා ගෙන යනු ලබයි.

දත්ත විශ්ලේෂණය කරන අතරතුර (backing storage) අමතර දත්ත ගබඩාවෙන් ඇතුලත් කර ගන්නා ලබන දත්ත නැවත විශ්ලේෂණය කොට නවතාවයෙන් යුතුව නැවත අමතර දත්ත ගබඩාවට ඇතුලත් කරනු ලබයි.

තොරතුරු (Information)

සමහරවිට හඳුනාගැන්ම පිනිසම පමණක් මෙම වචනය දත්ත හා තොරතුරු වශයෙන් යොදනු ලබයි. සමහර තොරතුරුද තවත් ක්‍රමයකින් දත්ත විය හැක.

ක්‍රමලේඛ (Program)

ක්‍රමලේඛයක් යනු පරිගණක භාෂාවකින් ලියන ලද උපදෙස් කිහිපයක එකතුවක් (Set of Instructions) ලෙස හැදින්විය හැක. ක්‍රමලේඛයක් විසින් කරනු ලබන්නේ පරිගණකය විසින් කල යුතු යම් කාර්යයකට උපදෙස් සැපයීම පමණකි.

දෘඩාංග හා මෘදුකාංග (Hardware and Software)

දෘඩාංග (Hardware)

පරිගණකය ඇතුලත හා පරිගණකය සමග භාවිතා කරන උපකරනයන් ඇතුලත ඇති ඉලෙක්ට්‍රොනික හා කාර්මික උපකරන මෙනමින් හැදින්වේ.

මෘදුකාංග (Software)

පරිගණකයේ භාවිතාවන සියලුම වර්ගයේ ක්‍රමලේඛන සහ ඊට අදාලවන ගොනු සඳහා මෙම නම භාවිතා වේ.

මෘදුකාංග වර්ග

(Application Software) මෙම මෘදුකාංග විශේෂ වූ කාර්යයන් කිරීමට සකසන ලද ඒවා වන අතර ඒවා පහත සඳහන් ලෙස වෙන් වේ.

විශේෂිත යෙදුම් මෘදුකාංග (Specialist application software)

විශේෂිත වූ කාර්යයන් කිරීමට ඊටම අදාල වූ ගොනු සමග ඇති මෘදුකාංග වර්ගයකි. උදාහරණයකට එකම වර්ගයේ ගණනක් විවිධ වූ ඉලක්කම් යොදා ලබාගන්නා උත්තරයක් දැක්විය හැක.

යෙදුම් පැකේජය (Application Package)

මේවා විශේෂ වූ කාර්යයන් කිරීමට සකසන ලද්දක් වුවද ඊටම නැදැකම් කිව හැකි කාර්යන් කිහිපයක් කිරීමටද ඊට හැකියාවක් ඇත. උදා- Word Processing Packages.

පද්ධති මෘදුකාංග (System Software)

මෙම ක්‍රම ලේඛන ඊට අදාල වූ ගොනු සමග ක්‍රියා කරනුයේ පරිගණකයට ඊට අදාලවූ ක්‍රියාකාරකම් කිරීමට පහසුව ලබාදීම සඳහාය. මෙම (System Software) හෙවත් පද්ධති මෘදුකාංග ඇතුලත පද්ධති මෙහෙයුම් (Operating System) නැමති ක්‍රම ලේඛයක් නැතිනම් ක්‍රමලේඛයන්ගේ එකතුවක් ඇත. මෙම පද්ධති මෙහෙයුම (Operating system) දෘඩාංග හා ගැටෙමින් පරිගණකයෙහි කාර්යක්ෂමතාවයට ඉමහත් සේවාවක් කරනු ලබයි. සමහර system application package එම application system එක නොමැතිව ක්‍රියා නොකිරීමට ද වග බලා ගනී. එසේම සමහරක් system software වර්ගයන් පද්ධති මෙහෙයුමේ (operating system) ක්‍රියා වලිය ඉක්මවා යයි. උදා- දෘඩාංග වලින් මෘදුකාංග කෙරෙහි කෙරෙන බලපෑම් කෙසේද යන්න බැලීමට පාවිච්චි කරනු ලබන system software දැක්විය හැක.

පියල් යාපා විසිනි

****

අතුරු ජාලය (INTER NET)

මෙම අතුරු ජාලය Inter Net යන්නෙහි තේරුම කුමක්ද යන්න අදටත් සමහරෙක්ට පැනයකි. එය කුඩා ජාල රාශියකින් සමන්විත සුවිසල් පරිගණක ජාලයක් යැයි සරලව හඳුන්වා දිය හැක. තවත් සමහරෙක් මෙය දකින්නේ කුඩා පරිගණක එක් වී නැගෙන දැවැන්ත යෝධයෙක් සේය. අතුරු ජාලයේ මුළු සමන්විත වන්නේ පුද්ගල පරිගණකයන්ගෙන් හෝ විශාල පරිගණක සේවා මධ්‍යස්ථාන වලිනි.

Inter Net මුල් අවස්ථාව පරිගණකයන් මුද්‍රණ යන්ත්‍ර හා සම්බන්ධ වන අයුරින්ම පරිගණකයක් තවත් පරිගණකයක් හා සම්බන්ධ කල හැක. මෙහිදී සිදු වන්නේ පරිගණක දෙක අංකිත සංඥා ඔස්සේ වැඩසටහන් හුවමාරු කර ගැනීමයි. මෙයට පරිගණක දැලවියක් (Net Work) යනුවෙන් හඳුන්වයි. මෙම දැලවිය අතුරු ජාලයේ (Inter Net) හි මුල්ම අවස්ථාවයි. සෑම තැනම විහිදී තිබෙන පුද්ගලික පරිගණක ලෝකයේ ප්‍රධාන පෙලේ පුස්තකාල, පුවත්පත් කාර්යාල, බැංකු හා වෙළඳ ව්‍යාපාර සමගත් පරිගණක වෙත වෙනමත් සම්බන්ධ වූ ජාලයක් සැකසීම මේ සංකල්පයයි. සත්‍ය වශයෙන්ම මෙය සන්නිවේදනයේ සුපිරි මාවතකි.

ලෝකයේ තිබෙන බොහෝ පරිගණක එකිනෙක බැඳෙමින්, තමන්ගේ තොරතුරු එකිනෙකා අතර හුවමාරු කරගනිමින් සිටී. මෙම පරිගනක ඉදිරියේ වාඩිවී සිටින්නෝද නිරායාසයෙන් බැඳෙනි ලංවෙනි.

අතුරු ජාල සේවාවන් සියල්ල කැටිකොට මෙසේ දැක්විය හැක.

1. ඉලෙක්ට්‍රොනික් තැපැල, මෙය නිවසේ ඉඳිවූ තැපැල් හලක සේවය ඔබට ඉටුකර දේ.
2. කතාබහ කර ගැනීම (මෙයින් වෙනසකට ඇත්තේ ඔබට කිවයුතු දේ යතුරු පුවරුව ආධාරයෙන් ටයිප් කල යුතුය)
3. දුර බැහැරක ඇති පරිගණකයක ඇති දත්ත ඔබගේ පරිගණක යතුරු පුවරු මගින් හැසිරවීමේ හැකියාව.
4. අතුරු ජාලයට සම්බන්ද දැවැන්ත පුස්තකාල පිරික්සීමේ හැකියාව.
5. අතුරු ජාල රේඩියෝව. මෙමගින් හඩකැවූ වැඩසටහන් පිරික්සීමේ හැකියාව.
6. අතුරු ජාල සාකච්ඡා මණ්ඩප.
7. වීඩියෝ දර්ශණ.

මේ ඔබ ලබන ප්‍රථිපලයන්ගෙන් කීපයක් පමණි. මෙහි අහිතකර ප්‍රථිපලද නැතිවාම නොවේ.

පරිගණක පිරිය දැන් මුදලාලිලා, නීතිවේදීන්, ආදරවන්තයන් හා දේශපාලකයින්ද, සිය ආධිපත්‍ය පතුරවා ගනිමින් සිටී. සත්‍ය වශයෙන්ම පාලකයෙක් අතුරු ජාලයට නැත. පාලකයෙක් නැති තැන පිරිහීමක් ඇත. සත්‍ය වශයෙන්ම අතුරු ජාලය අද මුහුණ දී සිටින්නේ මෙම ප්‍රශ්ණයටය.

මෙම ජාලය ඉදිකර ඇත්තේ මධ්‍යම උපදෙස් මධ්‍යස්ථානයකින් තොරවය. මේ නිසා ජාලයට සම්බන්ධ වන්නන් එලවා දැමීමට කිසිවෙකුට හැකියාවක් නැත. කිසිවෙකුට පද්ධතිය ක්‍රියා කරවීම අත්හිටු වීමටද හැකියාව නැත.

කොටින්ම පරිගණක ජාලයට අලුතින් ඇතිකර ගත හැකි සම්බන්ධතා ගනණින් අසීමිතය. ඒකාධිකාරීත්වයට ඉඩ නොතබන අතර විමධ්‍යගත කිරීම දිරි ගන්වනු ලැබේ. මෙය අතුරු ජාලය පිළිබඳ දෙන සහතිකයකි.

සමහරුන් පවසන පරිදි පරිගණක තොරතුරු නිර්ලෝභීව සැමටම භුක්ති විදිය හැකි මඟක් පැදෙන බැවින් අතුරු ජාලය වඩා ප්‍රජාතන්ත්‍රවාදී එකක් බවයි.

අතුරු ජාලයේ බිහිවීම ගැන බටහිර රටවල වැඩිහිටියෝ මහත් බියක් හට ගැනිත. මන්ද සෑම දෙයටම ඉඩ පහසුකම් ඇති බැවින් නිල් චිත්‍රපට වෙළඳුන්ගෙන් දරුවන් ආරක්ෂා කර ගැනීම පිළිබඳවය. දරුවන්ගේ මනසට නොගැලපෙන වැඩසටහන් නැරඹීමෙන් මග හැරවීමට ඔවුන්ට ඉඩක් නැත.

මෙයට විසඳුමක් ලෙස මෙම වැඩසටහන් සඳහා රහස් සංඥා (pass word) භාවිතා කිරීම උචිත යන්න යෝජනා වුවත්, වැඩිහිටියන්ගේ කතිං රිංගා යාමට තම් දරා ඇති නව යුගයේ කුඩාවුන් මෙම රහස් සංඥාව සොරාගත නොහැකියයි කිව නොහැක.

තවත් අය කියන්නේ යතුරු පතක් වැඩිහිටියන්ට නිකුත් කළ යුතු බවයි. නමුත් කවරෙකු හෝ යම් දෙයක් සඳහා උනන්දු වන්නේ නම් එම පුද්ගලයා නැවැත්වීම තරමක් උගහට කරුණක්ය.

තත්වය කෙසේ වුවත්, නවීන ලෝකයේ අතුරුජාල ව්‍යාප්තිය නම නැවැත්විය හැක්කක් නොවේ.

ගොඩ්ෆ්‍රි එස් කුමාර විසිනි

2වන සංඥා රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය (ස්වේ) හි වගතුග

හමුදා නියෝග 21/80 යටතේ වර්ෂ 1980 ක් වූ අගෝස්තු මස 07 වන දින 1වන බලසෙණය ශ්‍රීලංකා සංඥා බලකාය (ස්වේ) යුධ හමුදා ස්වේච්ඡා බළකායේ බලසෙණයක් වශයෙන් 1980 අප්‍රේල් මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නගා සිටුවීමේ උපදෙස් නිකුත් කරන ලදී. පසුව හමුදා නියෝග 5/89 යටතේ 1989 ජනවාරි මස 26 වන දින 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ස්වේ) හි නඟා සිටුවීමේ උපදෙස් 1980 අප්‍රේල් මස 25 දින සිට බලපාන පරිදි අතිගරු ජනාධිපති තුමා විසින් ප්‍රකාශයට පත්කර ඇත.

2 ශ්‍රීලංසංබ (ස්වේ) සඳහා නිලධාරීන් 8 ක් හා සෙසු නිලයින් 200 ක ගෙන් සමන්විත වන සේ සංස්ථාව අනුමත කර ඇති අතර, ඒකක සංස්ථාවට නිලධාරීන් 32 ක් හා සෙසු නිලයින් 688 දෙනෙකු සඳහා අනුමැතිය ලබා ගැනීම් වස් උසස් මූලස්ථාන අමතා ඇති බැව් සඳහන් කරමි.

මෙතෙක් දෙවන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ස්වේ) ස්වාධීනව තනි ඒකකයක් වශයෙන් රාජකාරියේ නියැලීමට අවකාශයක් නොලැබීම හේතුවෙන් මෙහි මූලස්ථානය පනාගොඩ පිහිටුවා 1 රෙජි: ශ්‍රී ලංකා සංඥා බලකාය යටතේ රාජකාරීන් ඉටු කරනු ලබයි.

මෙහි අණදෙන නිලධාරී වශයෙන් 1 රෙජි: ශ්‍රීලංසංබ ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර් ඒ කඩුවෙල ක්‍රියා කරනු ලබන අතර, 2 ශ්‍රීලංසංබ (ස්වේ) බලසෙණයේ බලසෙණාධිපති වශයෙන් කපිතාන් එල්ජේඒසී ද පීරිස් කටයුතු කරනු ලැබේ. මෙම බලසෙණයට අයත් නිලධාරීන් සහ සෙසු නිලයින් 1, 3, 5 සහ 6 ශ්‍රීලංසංබ යන නිත්‍ය ඒකක වෙත යා කර එමගින් සංඥා රාජකාරීන් හි නියැලෙන අතර, වැහාවිචැ පදනම මත බඳවාගෙන සිටින අයවළුන් 40 ක් පමණ දෙනාද උතුරු නැගෙනහිර ආදී ක්‍රියාන්විත ප්‍රදේශයන් වල රාජකාරියේ නියැලේ.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කල යුත්තක් ඇත. එනම් රටෙහි ඒකීය භාවයත්, භෞමික අඛණ්ඩතාවයත් වෙනුවෙන් දිවිදුන් 2 ශ්‍රීලංසංබ (ස්වේ) රණවිරුවන්ය. මේ වන විට සේවයේ යෙදී සිටියදී නිලධාරීන් 03 ක් සහ සෙසු නිලයින් 14 දෙනෙකු තම ජීවිත රට වෙනුවෙන් පරිත්‍යාග කොට ඇත. ඔවුන් සියළු දෙනාගේ සේවය අදත්, හෙටත් නිබඳවම අප සිහිපත් කරන්නෙමු.

සැරයන් ජයවීර විතානගේ
2 රෙජි: ශ්‍රීලංකා සංඥා බලකාය (ස්වේ)
පනාගොඩ

රට වෙනුවෙන් දිවි පිදු රණවිරු
මේජර් වීපීකේපී රාමනායක - 3 ශ්‍රීලංසංබ

3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් නි/61495 මේජර් වීපීකේපී රාමනායක යාපනය 512 බලසේනාවේ මාණ්ඩලික නිළධාරී III වශයෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී කුරිරු ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයකට ලක්වීමෙන් 1988 ක්වූ සැප්තැම්බර් මස 11 වන දින මිය යන ලදී.

1967 ක්වූ මාර්තු මස 07 වන දින බොරැල්ල ද සොයිසා කාන්තා රෝහලේදී මෙලොව එලිය දුටු වීදාන පතිරන්නැහැලාගේ කමල්නාත් ප්‍රසන්න රාමනායක රණවිරුවා වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. පාසැලේදී අධ්‍යාපන කටයුතු වලදී මෙන්ම ක්‍රීඩා සහ පොදු කටයුතු වලදීද කැපී පෙනුනු ශිෂ්‍යයකු වූ අතර, අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ඉතා විශිෂ්ඨ ලෙස සමත්වී තම දිනු දේශය සුරැකීමේ උදාර අරමුණ පෙරදැරි කර ගනිමින් 1988 ක්වූ ඔක්තෝබර් මස 06 වන දින ශ්‍රී ලංකා යුධ හමුදා නිත්‍ය බලසේනාව වෙත කෙඩෙට් නිළධාරියෙකු ලෙස බැදී කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය වෙතින් ශාස්ත්‍රවේදී ආරක්ෂක විද්‍යා පීඨ උපාදිය හදාරා 1990 ක්වූ ඔක්තෝබර් මස 05 වන දින 2/ලුතිනන් නිලයෙහි අධිකාරියට පත්කර ශ්‍රීලංකා සංඥා බලකාය වෙත ඇතුලත් කරන ලදී. ඉන් අනතුරුව රාජකාරීන් ඉටු කිරීම වස් 1990 ක්වූ ඔක්තෝබර් මස 20 දින සිට 3 වන රෙජිමේන්තුව, ශ්‍රීලංකා සංඥා බලකාය වෙත අනුයුක්ත කරන ලදී. එවක සිට මේ දක්වා තමාගේ ගෞරවයත් යුධ හමුදාවේ ගෞරවයත් ශ්‍රී ලංකා මාතාවගේ ගෞරවයත් ආරක්ෂා කරමින් ශ්‍රී ලංකා සංඥා බලකාය වෙනුවෙන් මහඟු සේවයක් ඉටුකල අතර තමාගේ සේවා කාලයෙන් වැඩි සේවා කාලයක් මඩකලපුව, වව්නියාව, යාපනය, ඇතුළු උතුරු නැගෙනහිර ප්‍රදේශ ගණනාවකම රාජකාරියෙහි නිරත වන ලදී. මෙම හෙළවිරුවා "වන්නි වික්‍රම, හයේ පහර, දුර ගමන, සත්බල, යාල්දේවී, ජයමහ, රිවිරැස" යන ප්‍රධාන පෙලේ ක්‍රියාන්විතයන් මෙන්ම අනෙකුත් ක්‍රියාන්විත රැසකට සහභාගී වී නිර්භීත නිළධාරියෙකු වශයෙන් තම රාජකාරීන් නොපිරිහෙලා ඉටු කරමින් මහඟු මෙහෙවරක් ඉටු කර ඇත. මෙම නිළධාරියා තම සේවා කාලය තුලදී ශ්‍රී ලංකා යුධ හමුදාවට ආවේනික වූ පහත සඳහන් පාඨමාලා වලින් දී සහ මෙතෙර දී හදාරන ලදී.

අ. තරුණ සංඥා නිළධාරි පාඨමාලාව - ඉන්දියාව
ආ. බණ්ඩ භාර නිළධාරි පාඨමාලාව - යුධ හමුදා පුහුණු පාසල - මාදුරුඔය
ඇ. බලඇණි ආධාරක අවි පාඨමාලාව - පාබල පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය

මෙම නිළධාරිගේ දක්ෂතාවයන් හේතුකොට ගෙන 1992 ක්වූ අප්‍රේල් මස 05 වන දින ලුතිනන් නිළයටද 1994 ක්වූ අප්‍රේල් මස 05 වන දින කපිතාන් නිළයටද උසස් කරන ලදී. මෙම නිළධාරිගේ සේවය ඇගයීම වස් "පූර්ණභූමි පදක්කම, රිවිරැස පදක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම" යනාදී පදක්කම් ප්‍රධානය කර ඇති අතර, රණක්ෂිතයට පත් වීම හේතුවෙන් "දේශපුත්‍ර පදක්කම" පිරිනැමීමට ද නිර්දේශ කර ඇත. ඉතා සාරවත් ගුණ ධර්ම වලින් සහ නැණවත් අදහස් වලින් පෝෂිත වූ මෙම තරුණ නිළධාරියා සැමවිටකම ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ මෙන්ම සෙසු නිළයින්ගේද ආදර ගෞරවයට පාත්‍ර විය. මෙවන් ආදර්ශමත් හමුදා දිවියක් ගත කරමින් සිටියදී බෙදුම්වාදීන්ගේ කුරිරු බෝම්බ ප්‍රහාරයකට ලක්වීමෙන් සිදුවූ මෙම අකල් මරණය ශ්‍රී ලංකා සංඥා බලකායටත්, ශ්‍රී ලංකා යුධ හමුදාවටත්, පොදුවේ මුළු මහත් ශ්‍රී ලංකාවාසී සැමටත් දැරිය නොහැකි විශාල පාඩුවකි. දිනු දේශයේ ඒකීයභාවයත් ස්වෛරීභාවයත් රැක ගැනීම සඳහා තම අවසන් සුසුම සහ රුධිරය ලක් දෙරණ මත හෙලූ උදාර නිළධාරිගේ අවසන් කටයුතු පූර්ණ හමුදා ගෞරව සහිතව 1998 ක්වූ සැප්තැම්බර් මස 13 වන දින 1730 පැයට නිට්ටඹුව කෝන්ගස්දෙනිය පොදු සුසාන භූමියේදී සිදු කෙරිණ.

විරුවාණෙනි, මතු උපදින සෑම භවයකදීම ඔබ්බිමේ හෙළ විරුවෙකු ලෙස අප අතරම ඉපදේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු. මින් මතු උපදින ආත්මයකදී මෙවන් අකල් මරණයකට ගොදුරු නොවේවා ! සසර කෙළවර අමාමහ නිවන් සුව ලැබේවායි පතන්නෙමු.

ඔබට ජාතියේ භක්ති ප්‍රණාමය හිමිවේවා !! !!

1 රෙජ් ශ්‍රීලංසංඛ ඒකකයට අයත් මියගිය නිලධාරීන් / සෙසු නිලයින්

රෙ. අ.	නිලය	නම	මියගිය දිනය	ස්ථානය
01. නි/61248	මේජර්	එම්එස්ඩී විජේනායක	93.07.25	වැලිඔය ජනකපුර
02. සෙ/65798	ඔනි 1	ආර්එම්ඒ වීරකෝන්	97.06.09	වාලච්චේන
03. සෙ/65965	සැරයන්	විජේරත්න ඒඑම්එන්	89.06.23	කොකුවිල
04. සෙ/66148	සැරයන්	වනිගරත්න කේඑම්	93.07.25	වැලිඔය ජනකපුර
05. සෙ/66616	සැරයන්	කුලතිලක පීපී	96.07.18	මුලතිව්
06. සෙ/65898	කෝප්‍රල්	කරුණාරත්න එස්ටී	91.07.02	ඒ.ක්‍රි.මු. කොළඹ
07. සෙ/66057	කෝප්‍රල්	මහින්දපාල ඒජ්ඩී	96.07.17	මිරාඹිඩ්
08. සෙ/275083	කෝප්‍රල්	චන්ද්‍රලාල් එච්එල්කේ	96.07.18	මුලතිව්
09. සෙ/275282	කෝප්‍රල්	ආරියසිංහ කේඩීපී	95.07.30	මූකරාල්
10. සෙ/275481	කෝප්‍රල්	ප්‍රියන්ත එච්එච්ඩීඩබ්	97.06.10	තාන්ඩිකුලම්
11. සෙ/66103	ලා/කෝ	අතුල එස්එස්	88.03.01	අතුරුගිරිය
